
THE
# WHITE HACKLE
වයිට් හැකල්
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



## SALUTES AND REMEMBERS FALLEN WAR HEROES
AT THE SLLI MEMORIAL

# EDITORS



**COLONEL OF THE REGIMENT**
Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc



**CENTRE COMMANDANT**
Brig MM Kithsiri RWP RSP USP



**DEPUTY CENTRE COMMANDANT**
Lt Col DAK Dissanayake WWV RWP RSP



**ADJUTANT RHQ SLLI**
Maj IR Hewapathirana RSP psc SLLI

**CHIEF CONSULTANT**
Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc

**EDITOR IN CHIEF**
Brig MM Kithsiri RWP RSP USP

**ASSISTANT EDITORS**
Maj IR Hewapathirana RSP psc SLLI ( Adjutant RHQ SLLI )
Maj TMAN Thennakoon RWP SLLI (White Hackle Publication)
Maj IMGN Jayathilaka SLLI (Officer in Charge )

**HONOURARY CONSULTANTS**
Gen RMD Ratnayake (retd) WWV RWP RSP VSV USP ndu psc
Lt Gen HV Athukorale (retd) VSV psc FBIM
Brig AVR Abesinghe (retd) KSV

**COMPUTER TYPE SETTING & DESIGNING**
L/Cpl Suranga RBP - White Hackle Publication

**PHOTOGRAPHERS**
Cpl Mahindasena AGMR
Cpl Pathmasiri UDN
L/Cpl Iranga HADS


# THE WHITE HACKLE
**JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY**
**94th Issue - October - December 2017**


## නැතිවුණ ඔරලෝසුව

එක්තරා ගොවියෙකුගේ ඔරලෝසුවක් තම ගොවිපළේදී නැති වුණා. එය එතරම් වටිනා ඒකක් නොවුනත්, ගොවියාට එය ඉතාමත් වටිනා එකක් වුණා. ගොවිපළෙ තිබුණු පිදුරු ගොඩවල් අස්සෙ එය සෑම තැනම සෙව්වත් ඔහුට එය සොයාගන්න බැරි වුණා. මහත් වෙහෙසට පත්වූ ගොවියා ඔරලෝසුව සොයන වැඩේ ගොවිපළ අවට ක්‍රීඩා කරන ළමයින් පිරිසකට පැවරුවා. සොයාගන්න කෙනාට වටිනා ත්‍යාගයක් ද දෙන බවට ඔහු පොරොන්දු වුණා. ළමයින් පිරිස ගොවිපළෙ ඇති පිදුරු ඒ මේ අත විසිකරමින් එය සොයන්නට වුණා. නමුත් කිසිවෙකුට එය හමුවුණේ නෑ. රාත්‍රිය උදා වුණා. සියල්ලෝම නිවෙස්වලට යන්න පිටත් වුණා. එක් කුඩා ළමයෙක් තමන්ට තව එක් වතාවක් ගොවිපළට යාමට අවස්ථාව දෙන ලෙස ගොවියාගෙන් ඉල්ලා සිටියා. ගොවියා ඊට කැමති වුනා. පැයක පමණ කාලයකට පසු ඔහු ඔරලෝසුව සොයාගෙන පැමිණියා. ගොවියා පුදුම වුණා. එය කළේ කෙසේදැයි විමසා සිටියා. මා කිසිවක් කළේ නෑ බිම දිගාවෙලා කණ් දීගෙන හිටියා. නිශ්ශබ්දතාවය නිසා මට ඔරලෝසුවේ කටු වැඩකරන ශබ්දය ඇසුණා. එවිට මට එය සොයාගැනීමට හැකි වුණා. නිහඬ මනස අවුල්වූ මනසට කළ නොහැකි දේ ඔබට කරදෙයි. මෙම කථාවෙන් අපට උගත හැකි පාඩම එයයි.

මෙම කුඩා උපමාවේ අන්තර්ගතය යුද හමුදා ජීවිතයට පමණක් නොව සිවිල් ජීවිතයටද ඉතාමත් වැදගත් පාඩමකි. අවුල් වූ මනසින් කළබලයෙන් රාජකාරි සිදුකිරීමේදී අප මුහුණ දෙනු ලබන අපහසුතා බොහෝ ය. මේ නිසා අප අතින් ඉතාමත් පිළිවෙළකට නිසි ක්‍රමවේදයකට කලට වේලාවට සිදුකළ යුතු කාර්යයන් අඩපණවී සිතෙහි අකාර්‍යක්‍ෂමතාවයක් ඇති වේ. රැකියාවේ ඉදිරි අනාගතයට මෙම තත්වය බෙහෙවින් බලපාලන අතර වඩාත්ම හොඳම දෙය නම් අවට වටපිටාව කෙසේ වුවද අප කරන කාර්‍යය ලිහිල් වූ මනසින් සිදු කිරීමයි. මෙම සිදුවීම් මෙතෙක් ඔබ අතින් සිදුවූවානම් එය සකසා ගන්නට ලැබූ නව වසරේ ඔබට හැකිවේවායි අප ප්‍රාර්ථනා කරමු.

# READERS PLEASE WRITE IN

The WHITE HACKLE the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 94th issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of "THE WHITE HACKLE" depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil, and English). What is value is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through " THE WHITE HACKLE ", the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write into " THE WHITE HACKLE " we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is " Ich Dien", " I Serve". Let " THE WHITE HACKLE " be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

# මෙවර කලාපයෙන්

**ඔක්තෝබර් - දෙසැම්බර් 2017**


**රෙජි ශ්‍රීලපාහ පුවත්**

02 සුබ මොහොතින් නව තනතුරුවලට පත්වූ නිලධාරීන් සහ සෙසුනිලයින්
03 අභිමන් මුදුනත අභියස රණවිරු සැමරුම
06 ශ්‍රීලපාහ 28 වන සංවත්සරය
08 මාලි දේශය බලා පිටත්ව යන ප්‍රථම සාම සාධක බළඇණිය
10 බියුගල් නලා පාඨමාලාව
11 පාලන පරීක්ෂාව 2017
12 පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය
16 ශ්‍රීලපාහ නිලධාරී සුහද හමුව

**සේවා වනිතා පුවත්**

17 මිහිදු සෙත් මැදුර සංචාරය

**විශේෂාංග**

18 අද්මිරාල් ඇල්ෆ්‍රඩ් තායි මහන් පිළිබඳ ලිපිය

**බළඇණි පුවත්**

19 1 ශ්‍රීලපාහ 28 වන නියමුවාණන්
20 2017 වසරේ සරඹ කිරුළ 4 ශ්‍රීලපාහ සිරසට
21 6 ශ්‍රීලපාහ බළඇණි පාඨමාලාව
22 25 වන සංවත්සරය සැමරූ 7 ශ්‍රීලපාහ
24 141 බළසේනාධිපතිගේ 8 ශ්‍රීලපාහ සංචාරය
25 9 (සෙව්) ශ්‍රීලපාහ 24 වන සංවත්සරය
26 10 ශ්‍රීලපාහ 10th Bakers
27 13 වන සංවත්සරය සැමරූ 12 ශ්‍රීලපාහ
28 ඉගෙනුමට සවියක් දුන් 15 ශ්‍රීලපාහ
29 මැරතන් ශූරතාවය දිනූ 16 ශ්‍රීලපාහ
30 17 ශ්‍රීලපාහ රෝද පුටු බෙදාදීමේ වැඩසටහන
31 18 (සෙව්) බළඇණි පාඨමාලාව
32 9 වන සංවත්සරය සැමරූ 19 ශ්‍රීලපාහ
33 20 ශ්‍රීලපාහ නව නිලධාරී නිවස්නය
34 ක්‍රීඩා ජයග්‍රහන රැසක් සමගින් පෙරට එන 21 (සෙව්) ශ්‍රීලපාහ
35 68 වන යුද හමුදා දිනය වර්ණවත් කළ 23 ශ්‍රීලපාහ
36 8 වන සංවත්සරය සැමරූ 24 ශ්‍රීලපාහ
37 7 වන සංවත්සරය සැමරූ 25 ශ්‍රීලපාහ
38 7 වන සංවත්සරය සැමරූ 26 ශ්‍රීලපාහ

**විවිධ**

39 ප්‍රහේලිකාව
40 සුබ මංගලම්
41 උපන්දින සුබපැතුම්


# වයිට් හැකල් TOP FIVE



01 “අභිමන් මුදුනත” අභියස රණවිරු සැමරුම 2017 2017. 10. 22



02 ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 28 වැනි සංවත්සරය 2017.10.23




03 මාලි දේශය බලා පිටත්ව යන ප්‍රථම සාම සාධක බළඇණිය 2017.11.30



04 පාබල මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2017. 12. 23,24



05 ශ්‍රීලපාහ නිලධාරී සුහද හමුව 2017. 12. 30




## කවරයේ කථාව

මෙවර ශ්‍රී ලංකා පාබල හමුදා වයිට් හැකල් 94 කලාපයේ මුල් කවරය සැරසෙන්නේ 2017.10.22 වන දින වාර්ෂිකව පවත්වනු ලබන ශ්‍රී ලංකා පාබල හමුදා රණවිරු සැමරුම් උළෙල සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් පැමිණි යුද්ධ හමුදාධිපති තුමන්ගේ හා එතුමන් කැටුව පැමිණි පාබල හමුදා රෙජිමේන්තු අධිපති තුමන්ගේ ඡායාරූපයකිනි.


**PRINTING & PUBLISHING**
Regimental Centre Sri Lanka Light Infantry
Telephone - 0112855204 / 0112855357 - 59
Ext - 57656 Fax- 0112855204
E-mail -editor.whitehackle@gmail.com
Website - www.army.lk/lightinfantry

# සුබ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට රෙජිමේන්තු අධිපති ඇතුළු සියලු නිලයින්ගේ උණුසුම් සුභපැතුම්



අණදෙන නිලධාරි
1 ශ්‍රීලපාහ
නි/64232 මේජර් කේවීඒකේ
කරුණාරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ



2 වන අණදෙන නිලධාරි
2(සෙවි) ශ්‍රීලපාහ
නි/5880 මේජර්
යූඑම්ටීසී ධනසිරි ශ්‍රීලපාහ



ගිණුම් අංශ භාර නිලධාරි
රෙම ශ්‍රීලපාහ
නි/65609 මේජර් කන්දෙගෙදර
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
ශ්‍රීලපාහ



නීති අංශ භාර නිලධාරි
රෙම ශ්‍රීලපාහ
නි/66192 මේජර්
එන්එම්පීකේ
නෙත්තිකුමාර ශ්‍රීලපාහ



ප්‍රකාශන අංශ භාර නිලධාරි
රෙම ශ්‍රීලපාහ
නි/5658 මේජර්
අයිඑම්පීඑන් ජයතිලක
ශ්‍රීලපාහ



නීති නිලධාරිණී
රෙම ශ්‍රීලපාහ
නි/68645 මේජර් පීපීටී
ජයසිංහ ශ්‍රීලයුපොදුසේබ



මානි 111 රෙම ශ්‍රීලපාහ
නි/6193 කපිතන්
කේඩීඩීඑන් රණසිංහ
ශ්‍රීලපාහ



විධායක අදිකාරි
8 ශ්‍රීලපාහ
නි/68885 කපිතන් එස්සී
ත්‍රිමාවිතාන ශ්‍රීලපාහ



විධායක අදිකාරි
19 ශ්‍රීලපාහ
නි/67429 ටීඑම්ආර්
තෙන්නකෝන් ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී ශ්‍රීලපාහ



උපකරණ පාලක
1 ශ්‍රීලපාහ
නි/67038 කපිතන් (උපා)
ඩීජේඑස් කුමාර ශ්‍රීලපාහ



ණය අංශ භාර නිලධාරි
රෙම ශ්‍රීලපාහ
නි/67210 කපිතන් එච්ඒ
කුමාර ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි
8 ශ්‍රීලපාහ
නි/70347 ලුතිතන්
ආර්එම්කේඑස් රත්නායක
ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි
24 ශ්‍රීලපාහ
නි/70000 ලුතිතන් පීඑච්
එපිටවල ශ්‍රීලපාහ



ප්‍රධාන ලිපිකරු
රෙම ශ්‍රීලපාහ
සෙ/314779 ඔනි I
ආර්එම්සීපී සමරදිවාකර



රෙඋපාසැමේ
8 ශ්‍රීලපාහ
සෙ/313851 ඔනි II
විජේතුංග ඩබ්ලිව්එම්ඒකේ



රෙඋපාසැමේ
4 ශ්‍රීලපාහ සෙ/314816
ඔනි II බණ්ඩාර එම්ආර්
ආර්පීඑස්



ප්‍රධාන ලිපිකරු
21(සෙවි) ශ්‍රීලපාහ
21ඩී00552 කෝප්‍රල් ප්‍රසන්න
සිල්වා ඩීඒආර්



When a man has done what he considers to be his duty to his people and his country, he can rest in peace. I believe I have Made that effort and that is, therefore, why I will sleep for the eternity.

Nelson Mandela, 1918 - 2013

# “අභිමන් මුදුනත” අභියස රණවිරු සැමරුම 2017



**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

**දේශයේ භෞමිකඅඛණ්ඩතාවය හා ස්වෛරීභාවය වෙනුවෙන් කුරිරු ත්‍රස්තවාදීන් සමග සටන් වැද මාතෘභූමියට සාමය උදාකරලීම උදෙසා ශ්‍රී ලංකා පාබල හමුදාව වෙතින් තම ප්‍රාණදානය කැප කළ නිලධාරීන් 168 දෙනෙක් හා සෙසුනිලයින් 3700 දෙනෙකු ඇතුලු අභීත රණවිරුවන් සදා අනුස්මරණය කිරීම සඳහා 28 වන රෙපිමේන්තු සංවත්සර දිනයට සමගාමීව දෙවන වරට පවත්වන ලද රණවිරු සැමරුම් උළෙල 2017.10.22 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමේන්තු මධ්‍යස්ථානයේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.**



ශ්‍රී ලංකා යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් විසින් කරන ලද ගෞරවණීය ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා වශයෙන් සපැමිණි ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් මහේෂ් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී යූඑස්ඒසීපීඑස්සී තුමන් වෙත රෙම ශ්‍රීලපාහ ප්‍රධාන දොරටුව අසල දී සම්මාන මුරයක් ලබාදුන් අතර, එතුමන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා, අභිමන් මුදුනත, රණවිරු ස්මාරකය අභියස දී මෙම සැමරුම් උත්සවය පවත්වන ලදී.

මෙම උත්සව අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමේන්තුමේන්තු මහාකාරක සභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද, ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් හිටපු යුද්ධ හමුදාධිපති ජෙනරල් එස්එච්එස් කෝට්ටේගොඩ (විශ්‍රාමික) ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී තුමන් ඇතුලු විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා මියගිය රණවිරුවන්ගේ පවුල්වල ලඟම ඥාතීන් 2000 කට අධික පිරිසක් ද සහභාගී විය. මෙදින රාත්‍රියේ ඉතාමත් අලංකාරවත් මල් පෙරහැරකින් දසත හැමූ සුවද දූපයන් මධ්‍යයේ ධාතු කරඬුව වඩමවා ආශීර්වාදාත්මක සර්වරාත්‍රික පිරිත් දේශනයක් පැවැත්වූ අතර, එහිදී රෙපිමේන්තු හා ඒකක වර්ණ ධජ වලට ආශිර්වාද පුද කරන ලදී. රෙපිමේන්තු මංගල හස්ථි කණ්ඩුල ද ආශීර්වාද පතා එදින පිරිත් මණ්ඩපය සමීපයට පැමිණෙන ලදී. පසුදා අලුයම මහා සංඝයාවහන්සේලා වෙත හීල් දානය පිරිනැමීමෙන් පසු සංවත්සර උත්සව කටයුතු සමාප්ත කරන ලදී.





















රෙම ශ්‍රීලපාහ පුවත්

# 28 වසරක අභිමානය

## ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 28 වන සංවත්සරය



**2017 ඔක්තෝබර් 23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ 28 වැනි සංවත්සරයේ මූලාරම්භය සනිටුහන් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඑීඩීඑී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙත අභිමානවත් සම්මාන මුරයකින් පිදුම් දෙන ලදී.**

යුද හමුදා විශේෂ චර්යා නියෝග මගින් 1989 ජූනි 30 දින මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා නියෝග නිකුත් කරන ලදී. ඉන් පසු 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව ස්ථාපිතව තිබූ පනාගොඩ දී 1989.10.23 වන දින රෙජිමේන්තු ධජය ඔසවා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී.

එතැන් පටන් පැමිණි ගමන් මගෙහි 28 වසරක් සපිරීම නිමිත්තෙන් රෙම ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. නිලධාරින් 25 දෙනෙකු සහ සෙසුනිලයින් 690 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් වර්ණ ධජ ඝණයන්ගෙන් සමන්විතව අභිමානවත් සම්මාන පෙළපාලියකින් ආරම්භ කෙරුණු මෙම සංවත්සර දිනයේ දී රෙජිමේන්තු අධිපති තුමන් විසින් සියලු නිලයින් අමතා ඉතා අගනා හරවත් දේශනයක් සිදු කරන ලදී. ඉන් පසුව 2015 වසරේ පැවති පාලන පරීක්ෂාවෙන් තෝරාගන්නා ලද නිත්‍ය හා ස්වේච්ඡා බළඇණි වෙත ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කිරීමේ අවස්ථාවට සහභාගී විය. එහිදී ප්‍රථම ස්ථානය දිනාගත් 11 ශ්‍රීලපාහ බළඇණිය වෙත ද, දෙවන ස්ථානය දිනාගත් 7 ශ්‍රීලපාහ බළඇණිය වෙත ද කුසළාන හා සහතිකපත් පිරිනැමූ අතර,

ශ්‍රීලපාහ ස්වේච්ඡා ඒකක අතරින් හොඳම බළඇණිය ලෙස 16(සෙව්) ශ්‍රීලපාහ ප්‍රථම ස්ථානය ද, දෙවන ස්ථානය 5(සෙව්) ශ්‍රීලපාහ යන බළඇණි ද කුසලාන හා සහතික පත් පිරිනමන ලදී. ඉන්පසු රෙජි අධිපති තුමන් ප්‍රමුඛ සියලු නිල දිවා භෝජන සංග්‍රහයෙන් පසු උත්සව මාලාව නිමාවට පත් විය.





හොඳම නිත්‍ය බළඇණිය ලෙස ප්‍රථම ස්ථානය දිනාගත් 11 ශ්‍රීලපාහ



හොඳම නිත්‍ය බළඇණිය ලෙස දෙවන ස්ථානය දිනාගත් 7 ශ්‍රීලපාහ



හොඳම (සෙව්) බළඇණිය ලෙස ප්‍රථම ස්ථානය දිනාගත් 16(සෙව්) ශ්‍රීලපාහ



හොඳම (සෙව්) බළඇණිය ලෙස දෙවන ස්ථානය දිනාගත් 5(සෙව්) ශ්‍රීලපාහ

## ලෝක සාමය උදාකරලීමේ භාරදූර කාර්යයට

# මාලි දේශය බලා පිටත්ව යන ප්‍රථම සාම සාධක බළඇණිය



**මාලි දේශය බලා දිවයිනෙන් පිටත්ව යන යුද හමුදා සාම සාධක හමුදා භට කණ්ඩය විසින් 2017.11.30 වන දින ආරාධිත අමුත්තා ලෙසින් සහභාගී වූ වත්මන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී තුමන් වෙත පාබල හමුදා රෙජිමේන්තු සරඹ පිටියේදී යුද හමුදා සම්ප්‍රදායානුකූලව සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී.**

ලෝක සාමය උදාකරලීමේ භාරදූර කර්තව්‍යයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉමහත් පරිශ්‍රමයක් දරමින් සිටියි. ලෝකයේ අනාරක්ෂිත රටවල් වෙනුවෙන් සාම සාධක භට පිරිස් ලබා දෙමින් තම වගකීම ඉටුකරනු ලබන මෙම සංවිධානයට එම මෙහෙයුම් සඳහා භට පිරිස් ලබාදෙන රටවල් අතර, ශ්‍රී ලංකා යුද හමුදාව තම කීර්තිය පතුරුවාලමින් මෙවර තම භට පිරිස් මාලි දිවයින බලා පිටත් කිරීමට නියමිතව ඇත.

බටහිර අප්‍රිකාවේ ගොඩබිමෙන් වටවූ ප්‍රදේශයක් වන මාලි දිවයින ඉන්දියන් සාගරයට මායිම්ව අරාබි මුහුද ආසන්නයේ පිහිටා ඇති වාර්ගික අර්බුදවලින් මහත් පීඩා විදින රටකි. මෙම තත්වය මැඩපැවැත්වීම සඳහා භට පිරිස් 200 කින් යුත් සංග්‍රාමික ආරක්ෂක කණ්ඩයක් (Combat Convoy Company) මාලි දිවයින බලා පිටත්ව යෑමට සූදානමින් සිටියි.

භට පිරිසෙන් ලද උත්තමාචාරය ගෞරවයෙන් පිළිගත් ප්‍රධාන ආරාධිත අමුත්තා සාම සාධක බළඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේපීවීල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ සමඟින් පෙලෙපාළිය පරීක්ෂා කිරීමට එක්වන ලදී. මෙම අවස්ථාවට යුද හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරල් ඩබ්ලිව්බීඩීපී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී විය. මාලි දේශයේ ප්‍රමුඛ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් මෙම භට පිරිස අවුරුද්දක කාලසීමාවක් සඳහා දෙසැම්බර් මස දිවයිනෙන් පිටත්ව යෑමට නියමිතව ඇත.

මාලි දේශයේ එක්සත් ජාතීන්ගේ

බහුවිධ ඒකාබද්ධ ස්ථායීභාවය ඇති කරලීමේ මෙහෙයුම් මූලස්ථානය වන "මිනුස්මා" (MINUSMA) එරට ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා අවැසි ආරක්ෂක හමුදා රාජකාරි කටයුතු සබැඳිව ක්‍රියාකරනු ලබයි. එරටේ ආණ්ඩු බලධාරීන්හට රටෙහි ස්ථාවරභාවය තහවුරුකරලීමට එක්සත් ජාතීන්ගේ මෙම "මිනුස්මා" සාම මෙහෙයුම් මධ්‍යස්ථානය බැඳී සිටියි. එක්සත් ජාතීන්ගේ සාම මෙහෙයුම් රාජකාරි සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවෙන් සහභාගී වූ පළමු බළඇණිය 2004 ඔක්තෝබර් මස 22 වන දින හයිටි රාජ්‍යය බලා දිවයිනෙන් පිටත් වූ අතර, ශ්‍රී ලංකා පාබල හමුදාවද එය නියෝජනය කරන ලදී. වත්මන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන හා පාබල හමුදා රෙජිමේන්තු අධිපති තුමන් එවකට කර්නල්වරයෙකු ලෙසින් එම බළඇණියේ අණදෙන නිලධාරි වශයෙන් සහභාගී වූ අතර, මෙවර මාලි දිවයින බලා පිටත්වන සාම සාධක බළඇණියේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් කේපීඑල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ඒකල කපිතාන්වරයෙකු ලෙසින් ඊට සහභාගී විය.

මෙම සාම සාධක මෙහෙයුම් සඳහා පාබල හමුදා රෙජිමේන්තුවෙන් නිලධාරීන් 4ක් හා සෙසුනිලයින් 50ක පිරිසක් සහභාගී වේ. මේ වන විට එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කරමින් සාමාජිකයින් 19000කට අධික සංඛ්‍යාවක් සහභාගී වී ඇති අතර, යුද නිරීක්ෂකයින් 156ක්, මාණ්ඩලික නිලධාරීන් 150ක් හා මාණ්ඩලික සහයක නිලධාරීන් 04ක් මෙම සාමසාධක රාජකාරි සඳහා සහභාගී වී ඇත.









# බියුගල් නලා පාඨමාලාවේ විශිෂ්ඨයෝ

යුද්ධ හමුදා උත්සව අවස්ථාවන්හිදී හා දෛනික රාජකාරි සිදුකිරීමෙහිලා අතිශය වැදගත් අංගයක් වන බියුගල් නලා වාදනය යුද හමුදා ඉතිහාසයන් තුල දක්නට ලැබෙන සාම්ප්‍රදායික හමුදා සන්නිවේදන මාධ්‍යයකි. පාබල හමුදා රෙජිමේන්තුවට අවශ්‍ය බියුගල් නලාකරුවන් පුහුණුකිරීමේ අරමුණින් මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මඟපෙන්වීම යටතේ 2(සෙවි) ශ්‍රීලපාහ ඒකකය විසින් බියුගල් නලාකරුවන් පුහුණුකිරීමේ පාඨමාලාවන් වාර්ෂිකව පවත්වනු ලබන අතර, ඒ සඳහා මෙම රෙජිමේන්තුව යටතේ ඇති බලඇණි වෙතින් හා වෙනත් රෙජිමේන්තු වලින් සෙනීන් සහභාගී කරවනු ලැබේ. මෙහි අවසන් පරීක්ෂණය යුද හමුදා නාට්‍ය හා රංග කලා අධ්‍යක්ෂක මණ්ඩලයෙහි ප්‍රධාන විනිසුරු මඬුල්ලක් අභිමුවෙහි පැවති අතර,නිසි පුහුණුව ලබා එම පරීක්ෂණය සමත් අයවලුන් පමණක් බියුගල් නලාකරුවන් ලෙස විසිර යනු ලබයි.

10 වන බියුගල් නලා පාඨමාලාව වන මෙම සය මාසික පාඨමාලාව 2017.04.21 දින සිට 2017.10.20 වන දින දක්වා පැවති අතර, ඒ සඳහා සහභාගී වු සිසුන් 22 කු සඳහා සහතික පත් ප්‍රදානය කිරීම පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී තුමන් විසින් රෙජිමේන්තු දේශන ශාලාවේදී සිදුකරන ලදී. මෙහිදී 5(සෙවි) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/ඩී101409 සාසෙ සෙනරත් එච්පීඩී පාඨමාලාව සාර්ථක ලෙස හදාරා ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදී.

තවද මේජර් පීඩබ්ලිව්ඩබ්ලිව්එන්එස්කේ වීරසිංහ 2(සෙවි) ශ්‍රීලපාහ අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ පාඨමාලාවේ උපදේශක රාජකාරියෙහි යෙදෙමින් මාහැඟි කාර්‍යභාරයක් ඉටුකරනු ලබන 2(සෙවි) ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/2ඩී01797 වර්ණ සැරයන් ප්‍රියන්ත නාලින්ද එස්ඒ සහ සෙ/2ඩී02392 කෝප්‍රල් දිසානායක එච්එස් යන උපදේශකයින්ගේ දායකත්වය මෙම පාඨමාලාවේ සාර්ථකත්වය සඳහා මනා පිටුවහලක් විය.





රෙම ශ්‍රීලපාහ පුවත්

# පාලන පරීක්ෂාව 2017

**ශ්‍රී ලංකා යුද හමුදා රෙජිමේන්තු සහ ඒකක තුල පවතින ගැටළු සොයාබැලීම, නිරාකරණය කිරීම හා ඉදිරි සැළසුම් පිළිබඳව සංවාදයට ගනිමින් පාලන කටයුතු විධිමත් සංවර්ධනයකට ලක්කිරීම සඳහා පවත්වනු ලබන පාලන පරීක්ෂාව මෙවර ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.**




රෙම ශ්‍රීලපාහ වෙත පැමිණි යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී හා අධ්‍යක්ෂක ජෙනරල්වරු, සියලු අධ්‍යක්ෂකවරු සහ නියෝජ්‍ය නිලධාරින් රෙජිමේන්තු මානි I (ක්‍රියා) විසින් පිළිගන්නා ලදී. පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ දේශන ශාලාවේදී පැවති මෙම සාකච්ඡාවට ප්‍රථමයෙන් පාබල හමුදා රෙජිමේන්තු ඉතිහාසය පිළිබඳව කෙටි හැඳින්වීමක් සිදුකරන ලදී. මෙහිදී පාබල හමුදා රෙජිමේන්තුව විසින් මව්බිම රුදුරු ත්‍රස්තවාදයෙන් මුදවාගැනීමේ ක්‍රියාවලියේදී දැක්වූ දායකත්වය පිළිබඳව ද, රෙජිමේන්තුව තුල සිදුකළ හා සිදුකෙරමින් පවතින සංවර්ධන ක්‍රියාදාමයන් වලදී නිලධාරින් හා සෙසුනිලයින් දක්වන ලද දායකත්වය පිළිබඳව ද විස්තර කරන ලදී.

පාලන පරීක්ෂාවේ ඉතිහාසය සහ එමගින් රෙජිමේන්තුව වෙත ලබාගතහැකි ප්‍රතිලාභ පිළිබඳව මාණ්ඩලික ප්‍රධාන විසින් පැමිණ සිටි පිරිස වෙත පැහැදිලි කළ අතර, පාලන පරීක්ෂාවක් සිදුකිරීම තුලින් රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකක වෙත පැනනැගී ඇති ගැටළු නිරාකරණය කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය කාර්යයක් බවත්, ඒ වෙනුවෙන් ලබා දෙනු ලබන අවස්ථාවන් ඵලදායී ලෙස උපයෝගී කරගනිමින් ලබාදෙනු ලබන උපදෙස් අනුව කටයුතු කර පැනනැගී ඇති ගැටළු කඩිනමින් නිරාකරණය කරගත හැකි බව මාණ්ඩලික ප්‍රධාන විසින් වැඩිදුරටත් පහදා දෙන ලදී.

## මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගෙන්

# යුද හමුදා සෙබළුන්ට ඇති බලපෑම





රෙජිමේන්තු පුහුණුවීම් දිනයට සමගාමීව 2017.11.22 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා ශ්‍රවනාගාරයේදී ශ්‍රී ලංකාව තුලට මත්ද්‍රව්‍ය රැගෙන එනු ලබන මත් ද්‍රව්‍ය ජාවාරම් කරුවන්ගෙන් ශ්‍රී ලංකා යුද හමුදා සාමාජිකයින්ට හා රටට ඇතිවන බලපෑම පිළිබඳව දේශනයක් සිදුකරන ලදී. මෙම කාලෝචිත දේශනය පැවැත්වීම සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන එස්එම් ප්‍රේමරත්න මහතා සහභාගී වූ අතර, මෙම දේශනය සඳහා සෙසුනිලයින් විශාල ප්‍රමානයක් සමගින් ලුතිතන් කර්නල් ටීඑන්කේ පෙරේරා ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් ද සහභාගී විය.

# පාබල මේලා 2017

## වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය






ශ්‍රී ලංකා යුද හමුදාවේ ආරම්භක රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාව 30 වසරක් පුරා පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ මානුෂීය මෙහෙයුමේදී ශ්‍රී ලංකාද්වීපයේ ස්වෛරීභාවය වෙනුවෙන් ප්‍රාණ දානය, කාය දානය දුන් හා දැනට සේවයේ නිරත වන අයවළුන්ගේ සුභසාධනය සඳහා අරමුදල් රැස්කිරීමේ අරමුණින් සංවිධානය කරනු ලබන පාබල මේලා 2017, වෙළෙඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය පස්වැනි වරටත් 2017 දෙසැම්බර් මස 23 හා 24 යන දිනයන් වල 30000 ක් පමණ අතිවිශාල ජනකායක් මධ්‍යයේ අති උත්කර්ෂවත් අන්දමින් හික්කඩුව මහජන ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.



මෙම වෙළෙඳ ප්‍රදර්ශන හා සැණකෙළිය පැවැත්වෙන දිනයන්හිදී ප.ව 4 සිට යුද හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුව මඟින් ඉදිරිපත් කරන ලද කමාන්ඩෝ සුනඛ සංදර්ශනය, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ සෙබලුන් විසින් ඉදිරිපත් කරන ලද වාහනයක් ගලවා කෙටි වේලාවකදී නැවත සවි කිරීමේ අංගය, ශ්‍රී ලංකා යුද හමුදා පොලිස් හේවා බලකායේ සෙබලුන් විසින් ඉදිරිපත් කරන ලද යතුරු පැදි සංදර්ශනය, පාබල රෙජිමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තූර්‍ය වාදක සංදර්ශනය හා සරඹ සංදර්ශනය හික්කඩුව ප්‍රදේශවාසීන්ගේ දිවිපෙවතට නව අත්දැකීමක් විය. තවද, සන්නාහ සන්නද්ධ බලකායේ සන්නද්ධ රථ, කාලතුවක්කු රෙජිමේන්තුවේ කාලතුවක්කු හා පාබල අවි ප්‍රදර්ශනයද සිත්ගත් අංගයන් විය.

සැණකෙළියේ ප්‍රථම දින ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක සේනා අණ හා මාණ්ඩලික විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගී වූ අතර, අවසාන දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීවී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගී විය. එදින මෙම රෙජිමේන්තුවට අයත් මියගිය,ආබාධිත, දැනට සේවයේ යෙදී සිටින හා සිවිල් සේවක මහතුන් වෙත ඔවුන්ගේ සුභ සාධක කටයුතු සඳහා මුදල් පරිත්‍යාගයන්ද සිදුකරන ලදී. මේ අනුව 1998.09.27 වන දින පරන්තන් ඉදිරි ආරක්ෂක වළල්ලේදී මියගිය ලාකෝ හරිස්චන්ද්‍ර ඩබ්ලිව්ඩී සෙබලාගේ මව කේඩී සීලවති මහත්මියට


සුනඛ සංදර්ශනය - රෙමකරෙ



යතුරුපැදි සංදර්ශනය - ශ්‍රීලයුපොහේබ


යතුරුපැදි සංදර්ශනය - ශ්‍රීලයුපොහේබ



ඉතා කෙටි වේලාවකදී ජීප් රථයක් සම්පූර්ණයෙන් ගලවා සවිකිරීම - ශ්‍රීලංවියාඉ

සහ 2007.06.12 වන දින වව්නියාවේදී මිය ගිය ලාකෝ ජනක බණ්ඩාර ආර්පී සෙබලාගේ පියා ආර්පී පියසේන මහතා වෙත නිවසේ වැඩකටයුතු සිදුකර ගැනීම සඳහා රු. 200000.00 බැගින් මූල්‍යාධාර ලබාදෙන ලදී. 2014 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 193 ලබාගෙන ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු ලබාගත් වර්ණ සැරයන් ගාමිණී නිශාන්ත පී ගේ දියණිය වෙත ද රු. 65000.00 වටිනා පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කළ අතර, තැලසීමියා රෝගය වැළඳී ඇති කෝප්‍රල් යාපා වයිඑම්එන්වල් කොනොනිගේ දියණිය හා කෝප්‍රල් රුක්මන් කුමාර කේඒ කොනොනිගේ දියණියන් වෙත ද, ශ්‍රීලපාහ ඒකකයට අයත්ව 1993.10.11 වන දින වෙත්තලකේනි කඳවුරේ ආහාර පිසීමෙන් සිටියදී උණුසුම් හොදි ඇසට විසිවීමෙන් දෑස නොපෙනෙන ආර්පී කරුණාරත්න (විශ්‍රාමික) සිවිල් සේවක මහතා වෙත ද වෛද්‍යාධාර වශයෙන් රු.  50000.00, වටිනාකමින් යුත් චෙක්පත් ප්‍රදානය කරන ලදී. මීට අමතරව හික්කඩුව නගරයේ රු. 160000.00ක වියදමෙන්, පාබල මේලා බස් නැවතුම, ඉදිකළ අතර, එම ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් ලබාදුන් යූඒ පත්මලතා මහත්මියට ද රු. 170000.00 ක වියදමකින් නව නිවසක් ඉදිකර දෙන ලදී. තවද මෙම උත්සවයෙන් ලද මුදලින් ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාව වෙතින් සිදු කරණු ලබන සුභසාධන කටයුතු සඳහා රුපියල් මිලියන 5ක මුදලක් එම ශාඛාවේ ගරු සභාපතිණී ධනංජනී කරුණාසේකර මැතිණිය වෙත එදින ලබා දෙන ලදී. පාබල මේලා බස් නව නැවතුම හික්කඩුව බද්දේගම මාර්ග යේ ප්‍රදේශ වාසින්ගේ පරිහරණය සඳහා ජනතා අයිතියට පත් කිරීම සහ එම බස් නැවතුම ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් ලබාදුන් යූඒ පත්මලතා මහත්මිය වෙත ඉදිකර දුන් නව නිවස ද එදින ප්‍රධාන ආරාධිත අමුත්තාගේ සුරතින් විවෘත කරන ලදී.

දිවයිනේ ජනප්‍රියම සංගීත කණ්ඩායම් දෙකක් වන සීදූව සකුරා සහ සනිධප සංගීත කණ්ඩායම් විසින් දෙදින පුරා මෙහෙයවනු ලැබූ මියුරු සංගීත ප්‍රසංගයට නර්තනයෙන් මහරගම පිණිරූ සහ අමාලි ප්‍රමුඛ ස්ටාර් ඩාන්ස් නර්තනයෙන් සහභාගී විය. දිනකට 15000 කට අධික පිරිසක් මෙම සංදර්ශනය නැරඹීමට පැමිණි අතර. යුද්ධයෙන් රණක්ෂයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන අභිමංසල 2 කඹුරුපිටිය රණවිරුවන්ද මෙම සැණකෙළියටසහභාගී විය. දෙදිනක් පුරා අති සාර්ථකව පැවති මෙම සැණකෙළිය 2017. 12. 25 වන දින අළුයම නිමාවට පත්විය.



සරඹ සංදර්ශනය - රෙම ශ්‍රීලපාහ සරඹ කණ්ඩය



තූර්යවාදන සංදර්ශනය
රෙම ශ්‍රීලපාහ තුවාක අංශය




සංස්කෘතික සංදර්ශනය
රෙම ශ්‍රීලපාහ සංකෘතික නර්තන අංශය



විවෘත කරන ලද නිවස සහ මගී බස් නැවතුම



රෙජිමේන්තු අධිපති විසින්
යූඒ පද්මලතා මහත්මියට නව නිවස ලබා දීම



ශිෂ්‍යත්වයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු හිමි වර්ණ සැරයන් ගාමිණි නිශාන්ත පී ගේ දියණිය වෙත ලැප්ටොප් පරිගණකයක් ලබාදීම




ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සඳහා සේවා වනිතා ශාඛාව වෙත රු. 5000000.00 ක ආධාර

පාබල මේලා ලොතරැයි දිනුම් ඇදීම





පාබල මේලා සංගීත ප්‍රසංගයේ අවස්ථාවක්





# SLLI OFFICERS' FAMILY MEMBERS GET TOGETHER | 2017 DECEMBER




ශ්‍රීලපාහ නිලධාරීන්ගේ පවුලේ සාමාජිකයින් සමගින් වාර්ෂිකව පවත්වන පාබල හමුදා නිලධාරි සුහද හමුව මෙවරත් 2017.12.30 වන දින නිලධාරි නිවස්නයේ දී අළංකාරවත් ලෙස සමරන ලදී.

මෙම උත්සවය සඳහා යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන් ආරාධිත අමුත්තා ලෙසින් සහභාගී විය. විනෝද ක්‍රීඩා රැසකින් සමන්විත වූ මෙම සුහද හමුව 4 ශ්‍රීලපාහ සංගීත කණ්ඩායමෙන් සංගීතවත් වූ අතර, ආරාධිත රංගන ශිල්පීන් දෙදෙනෙකු වූ මහින්ද පතිරගේ හා එරික් අබේවර්ධන යන ශිල්පීන් විසින් පැමිණ සිටි පිරිස විනෝදමත් කරන ලදී.









# මිහිඳු සෙත් මැදුරේ නේවාසික රණවිරුවන්ගේ සුවදුක් බැලූ ශ්‍රීලාපහ සේවා වනිතාවෝ...





යුද හමුදා සේවා වනිතා ශාඛාවෙන් කළ දැනුම් දීමකදී ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති ධනංජනී කරුණාසේකර මැතිණියගේ උපදෙස් පරිදි සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් පිරිසක් 2017.10.31 වන දින අත්තිඩිය මිහිඳු සෙත් මැදුරෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීමේ සංචාරයක නිරත විය. එම සංචාරයේදී නේවාසික රණවිරුවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් ලබා දුන් අතර එම පරිශ්‍රයේ ඉදිවෙන බුදු මැදුරෙහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 50000.00 ක මුදලක් ද පරිත්‍යාග කරන ලදී


## ඩිජිටල් ඡායාරූප මුද්‍රණයට පිවිසෙයි




ශ්‍රී ලංකා පාබල හමුදා වයිට් හැකල් ප්‍රකාශන අංශය වෙතින් දැන් ඩිජිටල් ඡායාරූප මුද්‍රණකරණය සඳහා පිවිසෙමින් ඔබට අවශ්‍ය පෝස්ට් කාඩ්,පාස්පෝට්, මුද්දර ප්‍රමාණයේ ඡායාරූප නවීන තාක්ෂණයෙන් කෙටි කාලයක දී මුද්‍රණය කරවා ගැනීමට පහසුකම් සලසා ඇත.

පෝස්ට් කාඩ් ප්‍රමාණයේ ඡායාරූප 01ක් රු. 50/-
පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 04ක් රු. 100/-
මුද්දර ප්‍රමාණයේ ඡායාරූප 06ක් රු. 100/-

# විද්වත් උදෘතයකට හරවත් විකාවක්

ලුතිතන් කර්නල්
මංජුල චන්ද්‍රසේකර විසිනි.



## Rear Admiral Alfred Thayer Mahan

*“Whoever who controls Indian Ocean controls Asia. This ocean is the key to seven seas in the 21st century, the destiny of the world will be decided in these waters”.*

"ඉන්දියන් සාගරය පාලනය කරන යමෙක් වේද, ඔහු ආසියාවද පාලනය කරයි. මෙම සාගරය 21 වන ශතවර්ෂයේ මුහුදු 7 අතරින් ඉතා වැදගත්ම සාගරය වන බැවින්, මෙම සාගරය පාලනය තුළ ලෝකයේ ඉරණම තීරණය වනු ඇත."

ඉහත ප්‍රකාශය අද්මිරාල් ඇල්ෆ්‍රඩ් තායි මහන් Alfred Thayer Mahan, විසින් 1890 දී ප්‍රකාශ කරන ලද්දකි. ඇමරිකානු මහාචාර්යවරයෙකු වූ Dennis Hart Mahan ගේ පුත්‍රයෙකු ලෙස 1840 සැප්තැම්බර් 27 දින ඇමරිකා එක්සත් ජනපදයේ West Point හි උපත ලද මෙම ශ්‍රේෂ්ඨ නැවියා විසින් ලෝක බල තුලනය පිළිබඳව ඉදිරිපත් කල ඉහත සඳහන් ප්‍රකාශය අප අද අත්විඳිමින් සිටී. 1890 දී මහන් විසින් ප්‍රකාශිත Influence of Sea Power upon History, 1660–1783 පොතට අනුව, නාවික බලය වැඩිදියුණු කර ගැනීම තුළ රටක ආධිපත්‍යය ලෝකය පුරා විසුරුවා හැරීම පිළිබඳව ඔහු විසින් මනාව කරුණු ඉදිරිපත් කර ඇත.

ඔහුගේ අනෙක් කෘතීන් අතර කැපී පෙනුන The Influence of Sea Power upon the French Revolution and Empire, 1793–1812 (1892) , In The Interest of America in Sea Power, Present and Future (1897) yd The Life of Nelson (1897) and The Major Operations of the Navies in the War of American Independence (1913). යන පොත් මගින් ද, නාවික වෙළඳ කටයුතු මෙහෙයවීම තුල ලබා ගත හැකි ආධිපත්‍යය ගැඹුරු ලෙස විග්‍රහ කර ඇත. එක්සත් ජනපද නාවික හමුදාවේ වසර 40 ක සේවයක් ඉටුකර ඇති මෙම විද්වතා එක්සත් ජනපද නාවික හමුදා විද්‍යාලයේ 1886 දී විදුහල්පති තනතුර දක්වා උසස්වීම් ලබා ඇති නිලධාරියෙකි. මොහුගේ නාවික හමුදා ජීවිතය තුල මොහු දක්ෂ නාවිකයෙකු නොවුවද, ඔහුගේ දේශණ තුල ඉතිහාසය පිළිබඳ කරුණු උපයෝගි කරගනිමින් ලබාදුන් අනාගත අභියෝගයන් පිළිබඳ දැක්ම මොහු විශිෂ්ඨයෙකු කිරීම සඳහා දායකවී ඇත.

ඉන්දියානු සාගරය ලොව තෙවැනි විශාලතම සාගරයයි.

අතීතයේදී පෘතුග්‍රීසීන් ඉන්දියානු සාගරය පාලනය කිරීමෙන් පසුව ලන්දේසීන්ගේ සහ ඉංග්‍රීසීන්ගේ පාලනයට නතුවිය. පසුව දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් අනතුරුව ඇමරිකා එක්සත් ජනපදයේ පාලනය, කලාපීය බලවතුන් වන ඉන්දියාව සහ චීනයේ පිබිදීමත් සමගම කෙමෙන් ගිලිහී යන බව 21 වන ශතවර්ෂයේ අපට දැකිය හැකි කරුණකි.

ඉන්දියන් සාගරයේ අද පවතින බල අරගලය තුල ඉන්දියාව සහ චීනය ඉන්දියන් සාගරයෙහි බලය තමන් වෙත නතු කර ගැනීම සඳහා විවිධ උපාය මාර්ග යොදමින් සිටී ඉන්දියාව මෙහිදී ඉන්දියන් සාගර කලාපයේ පිහිටි රට-වල් අතර, ද්විපාර්ශවික සබඳතා වැඩි දියුණු කිරීම සඳහා ගොඩ නගන ලද "ඉන්දියන් සාගර සමුද්‍රීය සමුළුව" Indian Ocean Rim Association for Regional Cooperation (IOR-ARC) and the Indian Ocean Naval symposium. සහ ඉන්දියානු සාගර රාමු සංගමය, වැනි බහුපාර්ශවික කවුන්සිල වල නව දිල්ලි සහභාගීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය කර ඇත. ඉන්දියාවේ වත්මන් ආණ්ඩුව පත්වීමත් සමගම කලාපීය රටවල් තුල සංචාරය කරමින් ද්විපාර්ශවික සබඳතා තර කර ගැනීම තුල ඉන්දියන් සාගරයේ ආධිපත්‍යය කෙරෙහි චීනය විසින් ගෙන යන වැඩ පිළිවෙලට එරෙහිව කිසියම් අභියෝගයක් එල්ල කර ඇත. එසේ වුවද, කලාපීය බලවතා ලෙස චීනයෙහි ඉන්දියන් සාගරය කෙරෙහි පතුරවන්නා වූ ආධිපත්‍යය මර්ධනය කිරීම සඳහා ඉන්දියාවට හැකියාවක් නොලැබෙන්නේ පකිස්ථානය ඉන්දියානු ක්‍රියා කලාපයන්ට එරෙහි රාජ්‍යයක් ලෙස කටයුතු කරන බැවිනි. ඉන්දියන් සාගරයේ ආධිපත්‍යය තහවුරු කරගැනීමට චීනයේ මුතු පට සංකල්පය **(String Of Pearl)** ලෙස චීනය විසින් දියත් කරනු ලැබූ භූ දේශපාලනික උපාය මාර්ගයන් තුල චීනය කලාපයේ සියලුම වැදගත් වරායන් හි නාවික බලය තහවුරු කර ගැනීම තුල 21 වන ශතවර්ෂයේ ආසියාවේ පාලනය චීනය සතු කර ගෙන ඇති බව දැකිය




මුතු පට සංකල්පය **(String Of Pearl)**

හැකිය.

ඒ අනුව, ඉහත සඳහන් අද්මිරල් ඒ ටී මහන් ගේ ප්‍රකාශයට අනුව චීනය ලෝකයේ දිශානතිය තීරණය කරනු ලබන ප්‍රධාන රට ලෙස නැගීඑනු ඇත. මෑත වසර වලදී චීනයේ ආරක්ෂක අයවැය වසරකට 10% දක්වා වැඩි කර සෝමාලියාවේ වෙරළ තීරයේ 1/3 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පාලනය කරමින් මියන්මාරය, පකිස්ථානය, ශ්‍රී ලංකාව හා වෙනත් තැන්හි ඉන්දියන් සාගරයේ වරායන් හි ආධිපත්‍යය පතුරුවා ගනිමින් තම නාවික හමුදා අභ්‍යාස ප්‍රවර්ධනය කර ගනිමින් සිටී.

වසර 2020 දී ලොව සුපිරි බලවතා වීමේ චීනයේ සිහිනය ජය ගැනීමට නම් ඉන්දියන් සාගරයේ බලය තහවුරු කරගැනීම චීනය අත්‍යවශ්‍යයෙන්ම සිදුකල යුතුය.

## 1 ශ්‍රීලපාහ වෙත පැමිණි

# 28 වන නියමුවාණන්

වසර 67 ක ප්‍රෞඩ ඉතිහාසයකට උරුමකම් ඇති 1 ශ්‍රීලපාහ ඒකකයේ 28 වන අණදෙන නිලධාරී ලෙසින් නි/64232 මේජර් කේඒඒකේ කරුණාරත්න ආර්ඩබ්ලව්පී ආර්එස්පී පීඑස්පී ශ්‍රීලපාහ 2017 නොවැම්බර් මස 10 වන දින සුභ මොහොතින් තම රාජකාරී ආරම්භ කරන ලදී.





ඒකකය වෙත පැමිණි නව අණදෙන නිලධාරී තුමන් වෙත කඳවුරු පිවිසුම අභියසදී සම්මාන මුරයක් පිරිනමා ඒකක දෙවන අණදෙන නිලධාරී මේජර් කේ අසංක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් මහත් අභිමානයෙන් පිළිගන්නා ලදී. චිරාගත සම්ප්‍රදායානුකූලව නව අණදෙන නිලධාරී තුමන් විසින් පොල්තෙල් පහන දැල්වීමෙන් පසු කිරිඉබ්බන්වැව රජමහා විහාරයේ විහාරාධිපති හිමියන් විසින් රැස්ව සිටි ඒකක මුලස්ථාන කාර්යය මණ්ඩලය පංචශීලයෙහි පිහිටවනු ලැබීමෙන් අනතුරුව සියලු ආශිර්වාද මධ්‍යයේ 1 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී ලෙසින් අභිෂේක ලැබීය. මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ යුද්ධ හමුදා සේවා කාලය තුලදී ලද අත්දැකීම් සහ පරිණතභාවය තුලින් හදාරන ලද දේශීය හා විදේශීය පාඨමාලාවන්ගෙන් ලද අත්දැකීම් සහ දැනුම තුලින් ඒකකයේ අභිවෘද්ධිය පිණිස තම නායකත්වය ලබාදෙන්නට නව අණදෙන නිලධාරී තුමන් හට ශක්තිය ධෛර්යය ලැබේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

# නික්ම යන අණදෙන නිලධාරී

1 ශ්‍රීලපාහ ඒකකයේ 27 වන අණදෙන නිලධාරී ලෙස 2015 දෙසැම්බර් මස 31 වන දින රජකාරී ආරම්භ කර වසර 2 කට ආසන්න කාලයක් රාජකාරී කරන ලද ලුතිතන් කර්නල් ආර්ඒ සමරනායක යූඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් සිය ධුර කාලය නිමකර 2017 ඔක්තෝබර් මස 14 වන දින ඒකකයෙන් නික්ම යන ලදී.
මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සේවය ඇගයීම වස් 1 ශ්‍රීලපාහ සරඹ පිටියේදී සම්මාන මුරයක් සහ වර්ණ ධජ ආචාර පෙළපාලියක් පවත්වන ලදී. ධුර කාලය අවසන් කර ඒකකයෙන් නික්ම ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමණි, ඔබගේ ඉදිරි හමුදා ජීවිතය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි 1 ශ්‍රීලපාහ ඒකකයේ සියලුම නිලයන් පාර්ථනා කරන්නෙමු.



# 2017 වසරේ සරඹ කිරුළ 4 ශ්‍රීලපාහ සිරසට



රෙජිමේන්තු අධිපතිතුමාගේ සංකල්පයකට අනුව වාර්ෂිකව පවත්වන අන්තර් ඒකක සරඹ තරඟාවලියෙහි 2017 වසරේ සරඹ කිරුළ රෙම ශ්‍රීලපාහ සියලු ඒකක සරඹ කණ්ඩායම් අභිබවමින් 4 ශ්‍රීලපාහ විසින් හිමිකරගන්නා ලදී. එම ජයග්‍රහනය සඳහා වූ කුසළානය සහ සහතික පත් 2017.10. 23 වන දින රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සුරතින් 4 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීකේඩී ධර්මසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ලබා ගන්නා ලදී.



# 6 ශ්‍රීලපාහ බළඇණි පාඨමාලාව



අණදෙන නිලධාරී මේජර් එච්ඩබ්ලිව්ආර් සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පූර්ණ මඟපෙන්වීම සහ අධීක්ෂණය යටතේ ගුවන් සංග්‍රාමික පුහුණු පාසල - බෝගොඩ දී පැවැත්වූ බළඇණි පුහුණු පාඨමාලාව පවත්වන ලදී. පාඨමාලාවේදී සියලුම නිලයින් හට යුද උපක්‍රම, රණබිම් ක්‍රම, ජීව වෙඩිතැබීම්, නගරබද සටන්, අවි රහිත සටන්, යුද බාධක තරණය වැනි පුහුණුවීම් වලදී තම හැකියාවන් වර්ධනය කරගත් අතර, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, ආපදා කලමණාකරණ මෙහෙයුම් යුද හමුදා නීතිය සහ සිවිල් නීතිය, පුද්ගලික සනීපාරක්ෂාව වැනි දේශණයන් තුලින් හා ප්‍රායෝගික පුහුණුවීම් වලින් ලද දැනුම ඉදිරි යුද හමුදා ජීවිතයට මහඟු අත්දැකීමක් විය. මෙම පාඨමාලාව 2017.07.15 දින සිට 2017.09.10 දින දක්වා පැවැත්විය.

# නික්ම යන නියමුවාණන් වෙත හරසර



6 ශ්‍රීලපාහ 12 වන නියමුවාණන් ලෙස ලුතිතන් කර්නල් කේපීවිල් අමුණුපුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ 2015.11.02 වන දින සිට 2017.06.29 වන දින දක්වා තනතුරෙහි රාජකාරි කිරීමෙන් පසු ඒකකයෙන් නික්ම යන ලදී. වසර දෙකකට නොඅඩු කාලයක් අණදෙන නිලධාරි තනතුරු හෙබවූ මෙම නිලධාරි තුමන් ඒකකයේ ඉදිරි උන්නතිය උදෙසා වේගවත් සංවර්ධන ක්‍රියාවලියක් දියත් කර සුවිශාල කාර්යභාරයක් ඉටුකරන ලදී. මිහින්තලය කඳවුර අවට ප්‍රදේශයන් හි රාජ්‍ය නිලධාරීන් මෙන්ම ආගමික නායකයින් සහ ජනතාව සමඟ මනා සම්බන්ධතාවයක් ගොඩනගාගත් මෙතුමන් තම අධීක්ෂණය යටතේ බෝගහයාය විහාරස්ථානයෙහි දාගැබ සහ මිහින්තලය රජමහා විහාරස්ථානයේ සංවර්ධන කටයුතු වැනි පූජා සත්කාර සිදුකරමින් සුවිශාල මෙහෙවරක් සිදු කරන ලදී.

ඒකකයෙහි උන්නතිය වෙනුවෙන් කෙටි කාලසීමාවක් තුල සුවිශාල මෙහෙවරක් කළ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ නික්ම යාම වෙනුවෙන් සම්මාන පෙළපාලියක් පිරිනමා ඒකකයේ සියලු නිලයින්ගේ උත්තමාචාරය පුදකරන ලදී.

# වෛද්‍ය දේශන

6 ශ්‍රීලපාහ කඳවුරේදී 2017.12.02 දින වෛද්‍ය දේශන මාලාවක් පැවැත්වීමට කටයුතු යොදන ලදී. එහිදී අනුරාධපුරය ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්ධන ව්‍යාපාරය වෙතින් සහභාගී වූ වෛද්‍ය නිලධාරි තුමා විසින් ලිංගාශ්‍රිත රෝග පිළිබඳව ද, මිහින්තලේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමිය විසින් බෝ නොවන රෝග පිළිබඳ හා අනුරාධපුර මානසික සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය වෙතින් සහභාගී වූ වෛද්‍ය නිලධාරි තුමිය විසින් සෙබලුන් වශයෙන් යුද හමුදාවේ ද සිවිල් සමාජය තුලදී ද දැකගත හැකි මානසික ගැටළු පිළිබඳව ද හරවත් දේශණ පවත්වන ලදී.



# 25 වන සංවත්සරය

## අභිමානයෙන් සැමරූ 7 ශ්‍රීලපාහ



7 ශ්‍රීලපාහ 25 වන සංවත්සරය 2017 නොවැම්බර් මස 20 වන දින ඒකකයේ රාජකාරි කරමින් සිට මාතෘභූමියේ සාමය වෙනුවෙන් තම කාය දානය කැපකල නිලධාරි 23 ක් සහ සෙසුනිලයින් 534 ක් සිහිපත් කර ඔවුනට පිං පෙත් පැමිණවීම අරමුණ කර අභිමානවත් ලෙස සමරන ලදී.

අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒටීඩීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ මියගිය රණවිරුවන්ගේ දෙමාපියන්, බිරින්දෑවරු සහ දූ දරුවන් සමගින් 2017.11.19 දින රාත්‍රියේ ඉතා අලංකාරවත් පෙරහැරක් සංවිධානය කොට ධාතු කරඬුව වැඩමකරවා පසුදා පහන්වන තුරු සර්ව රාත්‍රික පිරිත් දේශනයක් පවත්වා උදෑසන භික්ෂුන් වහන්සේ විසි-පස්නමක් විෂයෙහි හීල්දානය පිළිගන්වා මියගිය සහ අතුරුදන් රණවිරුවන් හා දැනට සේවයේ යෙදී සිටින සියලුම රණවිරුවන් වෙනුවෙන් පුණ්‍යානුමෝදනාවක් සිදු කරන ලදී.

2017.11.20 වන දින මියගිය රණවිරුවන් සිහිපත් කරමින් කඳවුරු භූමියේ ඉදිකර ඇති රණවිරු ස්මාරකය



අභියස පැවැති රණවිරු සැමරුම් උත්සවය සඳහා අණදෙන නිලධාරිගේ ආරාධනයෙන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේවීඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගී විය. මෙම බළඇණියේ මුල්ම දෙවන අණදෙන නිලධාරී ධූරය හා දෙවැනි වරට අණදෙන නිලධාරි තනතුර හෙබවූ එතුමන් මෙම ඒකකයට පැමිණීම ඉමහත් ගෞරවයක් වූ අතර, උත්සවය සඳහා 57 වන සේනාංකයේ සේනාංකාධිපති, රෙජිමේන්තු මධස්ථානයේ සේනාවිධායක, ආසේමු(කිලි) බ්‍රිගේඩියර් ප්‍රමානි, බලසේනාධිපතිවරුන් ඒකක අණදෙන නිලධාරිවරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී විය. ආරාධිත අමුත්තා

විසින් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝහාර දැක්වීමෙන් අනතුරුව මියගිය රණවිරුවන් වෙනුවෙන් ලුතිතන් කර්නල් ධනංජය විජේසිංහ ආර්එස්පී ශ්‍රීලපාහගේ ආදරණීය බිරිඳ හා පරම වීර විභූෂණ පදක්කමින් පුද ලද ලාන්ස් කෝප්‍රල් සේනාධිරත්න රණවිරුවාගේ සදාදරණීය මෑණියන් සමඟින් අනෙකුත් මියගිය හා අතුරුදන් වූ රණවිරුවන්ගේ දූ පුතුන් හා ලඟම ඥාතීන් විසින් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදී. නිලධාරි නිවස්නයේ පැවති දිවා භෝජන සංග්‍රහයෙන් පසු 25 වන රජිත ජයන්තිය සිහිගන්වමින් අණදෙන නිලධාරි විසින් ආරාධිත අමුත්තා වෙත සමරු තිලිණයක් ලබාදෙන ලදී.




# සෙබල සිතක සිතුවිලි

## වස්සානයම මැලවිලා



වස්සානයම මැලවිලා
දුර පෙන මාවතේ...
දිව යන්න වාරු නෑ
හති වැටෙයි ජීවිතේ
පුංචි සමනල් වියේ
පාපු දඟ සැඟවිලා
මහමෙර හිස මුදුනේ
හොවා හෙම්බත් වෙලා...
T56 අවිය ලග
ජීවිතය නැවතුනා

**සාසෙ ප්‍රියංකර එච්ජීඒඑච්**
**1 ශ්‍රීලපාහ**

## පුතුගේ ඉල්ලීම

දහසක් යුග දුක් විදිමින් කතරේ
මව්බිම නැමති දේශය බේරා ගන්නේ
සිතමුත් චිදා ගත් තීරණ අප ගැනම
පුවසුවේ අපිට අම්මේ වදිනෙමි ඔබට

ගුරුකුළ විසේ ශිල්පය සතර මගපෙන්වා
ඔබ බුදුපියේ තල් අරණේ දිවි ගෙව්වා
ඉගෙනුම මුලට නැත අගහිඟ මග පෙන්වා
සැළකුවේ අපට ඇස් යට ඔබ දුක හංගා

පැවසුවේ පුතේ සරසවි යන්නටයි කියා
එනමුත් පියේ ඔබේ සිතිවිල නිමල වුනා
සමා වෙනු මැනවි හැකි තා වෙර දැරුවා
මේ භවයේ ඉරණම මෙය යැයි සිතුවා

සිතුවිල්ලට ඉඩදී ඔබ ගිය පාරේ
යම්ද මමත් මල්ලී සමගින් තෝසේ
නොබලනු එපා අප දෙස පිය රජුනි අනේ
දෙනු මැන අතක් නැගිටින්නට මේ ලෝකේ

**සාසෙ රාජපක්ෂ ඩබ්ඒසීඑස්එස්**
**අණ හා පාලන කණ්ඩය 25 ශ්‍රීලපාහ**

## නිදියනු පුතුනේ...

රන් ටිකිරි සිනා පා මා නිවසට සිරිය ගෙනා
සතුටින් ඉපිලි මගෙ ලෝකය එළිය උනා....
බඹරු ගයයි ගී නුඹ ගැන රෑ වරුණා
එගී අසා මල් බඹරුන් විය උරණා...
වළාකුලක හිඳ සුරඹුන් කතා උනා
සුර ලෝකය වෙත නුඹ යන්නට රැගෙනා...
රංචු පිටින් සමනළයන් මී උරනා
සනසන අටියෙන් පුතු මුව මල් රොනිනා..
විහිදෙනු දැක තෙද දිනිසුරු රැස් කිරනා
සලා සුළඟ පුතු යහනට සිහිළ ගෙනා...
රන් සිනා සලා නුඹ යහනේ වැද පෙමිනා
හිරු පලවා හැර සඳු අහසට නැගුනා...
සඳ කැලුම් පෙරා විත් පුතු සිඹිමින් කියනා
නිදියනු පුතුනේ හෙට දින රජ කරනා...

**සාසෙ රත්නායක ආර්එම්එන්පී**
**බුද්ධිඅංශය 12 ශ්‍රීලපාහ**



## HEADLIGHT

ස්තූතියි මිතුර ඔබට
මට ලබා දුන් පණිවුඩයට
ඉන්නා බව ඉදිරියෙන් රථවාහන පොලීසිය
එහෙත්... අවශ්‍ය නැත
මා නීතිගරුක රියදුරෙකි...
ඔබ මා පසුකර ගියාට දුක නැත
ඒ මා ඔබ පසුකර පැමිණ ඇති බැවිනි
ප්‍රවේසමෙන්, ඉවසීමෙන් රිය පදවන්න
ඔබ නිහඬව මා පසුකර නොයන්න
නලා හඬ නගන්න ඒ ඔබේ හඬින් මා
අවදි වන බැවින් තවත් බොහෝ දුරක්
ගමන් ගත හැක මට ඉක්මන් නොවන්න
අප සියලු දෙනාම අවසානයේ යන්නේ එකම තැනකට ය
එය කිසිවෙකුට වෙනස් කළ නොහැකි
වෙනස් කළ හැක්කේ
කළ හොඳ නොහොඳටම පමණි...

**සාසෙ කිත්සිරි කේඑම්යූ**
**12 ශ්‍රීලපාහ**



# ත්‍රිවිධ හමුදා මානසික සුවසහන භාවනා මධ්‍යස්ථානයේ දාන ශාලාවට මුල්ගල තබමින්

ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා ඉදිකරනු ලබන පූඩලුගල බවුන්සෙත් සුවසහන භාවනා මධ්‍යස්ථානයේ නවතමයෙන් ඉදිකරනු ලබන දාන ශාලාවට මුල්ගල තැබීමේ කටයුතු 2017.10.21 වන දින ආරක්ෂක ලේකම් තුමා සහ යුද්ධ හමුදාධිපති තුමාගේ සහභාගීත්වයෙන් සිදුකරන ලද අතර, ඒ සඳහා මෙම ඒකක අණදෙන නිලධාරි තුමා සහ භට පිරිස් ද සහභාගී විය. මෙම භාවනා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු දැනට වසර 05 ක පමණ කාලයක සිට සිදුකරනු ලබන අතර, ඒ සඳහා ශ්‍රම දායකත්වය 8 ශ්‍රීලපාහ ඒකක භටපිරිස් වෙතින් ලබා දෙන ලදී.





# 141 බළසේනාධිපතිගේ 8 ශ්‍රීලපාහ සංචාරය



141 වන බළසේනා මුලස්ථානයේ නව බළසේනාධිපති වශයෙන් වැඩ භාරගත් බ්‍රිගේඩියර් ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් 2017.10.06 වන දින 8 ශ්‍රීලපාහ ඒකකයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. ඒකකය වෙත පැමිණි බළසේනාධිපති තුමා වෙත සම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. අනතුරුව අණදෙන නිලධාරි විසින් ඒකකය සිදුකරනු ලබන දෛනික රාජකාරි, ප්‍රජාසත්කාරක සේවාවන් හා විවිධ ව්‍යාපෘතීන් පිළිබඳව පැහැදිළි කිරීමෙන් පසු නිලධාරි නිවස්නයේ සුදානම් කර තිබූ තේ පැන් සංග්‍රහය බුක්ති විඳීමෙන් පසු සමරු පොතෙහි තම සටහන තබා කඳවුරෙන් නික්ම යන ලදී.

# 24 වන සංවත්සරය

## අභිමානයෙන් සැමරූ 9(සේවා) ශ්‍රීලපාහ




24 වන බළඇණි දින උත්සවයේ සමාරම්භය සනිටුහන් කරමින් 2017.11.01 දින අණදෙන නිලධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ වෙත ගෞරවාන්විත සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී.

එදින අණදෙන නිලධාරි තුමන් භට පිරිස් ඇමතූ අතර, පසුගිය කාලසීමාවේදී මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම හා කොළඹ ප්‍රදේශයට ඇතිවූ ගංවතුර තත්වයේදී පීඩාවට පත් ජනතාවගේ සුබසාධනය උදෙසා කටයුතු කිරීම තුලින් යුද්ධ හමුදාව වෙතින් හා සිවිල් සමාජය තුලින් උසස් ප්‍රශංසාවක් සහ ගෞරවයක් අප ඒකකය වෙත හිමි වු බවත්, පාබල හමුදා සමාජිකයින් වන අප "සේවය කරමි" යන උදෘත පාඨයෙන් පැවරෙන රාජකාරින් හා වගකීම් අන් අයට වඩා මනා ලෙස අවබෝධ කරගෙන මාතෘ භූමියත් එහි වෙසෙන ජනතාවත් වෙනුවෙන් ඉටු කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය හා අතුරුදන් වූ ඒකකයේ සියලුම නිලයින්ට ද, 2004.12. 26 වන දින සුනාමි රළ පහරට හසුවී මියගිය හා අතුරුදන් වූ සියලුම සෙසුනිලයි න්ට ද පිං අනුමෝදන් කොට ආබාධිත වූ රණවිරුවන්ට ද දැනට ඒකකයේ රාජකාරියේ නියුතු සාමාජිකයින්ට සහ සිවිල් සේවක මහතුන් හට සෙත් පතා එගොඩ කැළණිය රජමහා විහාරස්ථානයේදී බෝධි පූජාමය පිංකමක් පවත්වන ලදී.





# 10 ශ්‍රීලපාහට 10th BAKERS නමින් නව බේකරියක්



10 ශ්‍රීලපාහ ඒකකය වෙත මහත් අඩුපාඩුවක් තිබූ බේකරියක අවශ්‍යතාවය ඉටුකරමින් සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉතා කෙටි කාලසීමාවක් තුල ඒකකය වෙත නව බේකරියක් ස්ථාපනය කරන ලදී.

අණදෙන නිලධාරි තුමාගේ පූර්ණ අධීක්ෂණය සහ මඟපෙන්වීම මත ඉදිකෙරුනු මෙම බේකරිය "10th Bakers" නමින් 2017.10.02 වන දින සුභ මොහොතින් විවෘත විය. නව බේකරිය ඉදිකිරීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඒකකයේ සියලුම නිලයින් දායක වූ අතර, වර්ණ සැරයන් නන්දසේන ආර්පී, ලාකෝ අත්තනායක ඒචම්එස්බී, සහ සාසෙ විජේකුමාර එම්ඒ යන සෙසුනිලයින් තිදෙනා විසින් මේ සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදී.

# 10 ශ්‍රීලපාහ ඒකකයේ සිවිල් සේවක මහතුන් වෙත නව විවේකාගාරයක්



මෙම බළඇණිය තම රාජකාරි කටයුතු සඳහා විවිධ ක්‍රියායන්විත ප්‍රදේශයන්හි ස්ථානගතවීමට සිදුවීම හේතුවෙන් ඒකකයේ සිටින සිවිල් සේවක මහතුන් හට තම කටයුතු පහසුකරගැනීම සඳහා විවේකාගාරයක් ලබාදීමට අවස්ථාවක් නොමැති විය. එම අඩුපාඩුව මගහරවමින් ඒකකයේ සියලුම නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිවිල් සේවකයින් හට විවේකාගාරයක් ඉදිකිරීම ඇරඹූ අතර, එහි ඉදිකිරීම් කටයුතු අවසන්ව 2017.11.11 වන දින සුබ මොහොතින් විවෘත කරන ලදී.

# 13 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ 12 ශ්‍රීලපාහ




බළඇණිය පිහිටුවා 2017.12.03 වන දිනට වසර දහ තුනක් සපිරීම නිමිති කොටගෙන 12 ශ්‍රීලපාහ තම බලඇණි දින සංවත්සර මහත් වූ අභිමානයෙන් සමරන ලදී.

අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්එච්එස්පීඑස් ද සිල්වා ආර්එස්පී ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් සහ ඒකකයේ සියලුම නිලයන්ගේ සහභාගීත්වයෙන් පුණ්‍ය කටයුතු හා සමාජ සත්කාර සිදු කළ අතර, 2017.12.01 දින චාරිත්‍රානුකූලව මහා සංඝරත්නය වඩමවා ඒකකය සමඟින් රාජකාරී කරමින් සිට රට ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන්ටත් ආබාධිත තත්වයට පත් රණවිරුවන්ටත් දැනට රාජකාරියේ නියුතු සෙබලුන් හා සිවිල් සේවක මහතුන්ටත් ඔවුන්ගේ පවුල් වල සියලුම සාමාජිකයන්ටත් සෙත්පතා ධර්ම දේශණාවක් හා මහා සංඝරත්නය විෂයෙහි අටපිරිකර පූජාකොට පුණ්‍යානුමෝදනා සිදුකරන ලදී. 2017.12.02 දින මුලතිව් වට්ටප්පලෙයි අම්මාන් කෝවිලේදී දේවාශිර්වාද පතා දේව පූජාවක් ද සිදු කර 2017.12.03 වන දින අණදෙන නිළධාරී තුමන් හට සම්මාන මුරයක් පිරිනමන ලදී. එහිදී අණදෙන නිලධාරී තුමන් විසින් සියලු නිලයන් අමතා මනා පුහුණුව හා විනයගරුකත්වය තුලින් ලබාගත් අතීත විජයග්‍රහණයන් රැකගනු වස් සමස්ත යුද හමුදාවේ කීර්තියත් ඒකකයේ අභිවෘද්ධියත් උදෙසා සියලු දෙනා කැපවී ඉදිරියටත් කටයුතු කරන ලෙස අවධාරණය කළ අණදෙන නිලධාරි තුමන් කඳවුරු භූමිය තුළ අඹ පැලයක් රෝපණය කරන ලදී.

සංවත්සර උත්සවය නිමිත්තෙන් අණදෙන නිලධාරී ඇතුලු නිලයින්ගේ සහභාගීත්වයෙන් තෙවන වරටද ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කල 12 ශ්‍රීලපාහ ඒකකය පිංබර මතකයන් රැසක් බලඇණි ඉතිහාසයට එක්කොට 13 වන බලඇණි සංවත්සර උත්සවයේ කටයුතු නිමාවට පත්කරන ලදි.





# ඉගෙනුමට සවියක්



ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් අංක.99, ගල්මැටියාව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථායට යාබදව ජීවත්වන අඩු ආදායම්ලාභී පවුලක ඉගෙනුමට දක්ෂතාවයන් දක්වන පාසැල් ශිෂ්‍යයෙකුගේ අධ්‍යාපන කටයුතු තවදුරටත් වර්ධන කිරීමේ අරමුණින් යුතුව මෙම ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්කේජේයු ජයරත්න ශ්‍රීලපාහ විසින් ලැප්ටොප් පරිගණකයක් පරිත්‍යාග කරන ලදී. අණදෙන නිලධාරි විසින් මෙම පාසැල් සිසුවාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට සෑම විටම උනන්දු විය යුතු ආකාරය පිළිබඳ මාහැඟි උපදෙස් ලබාදී එම සිසුවා දිරිමත් කරන ලදී.

# නවීකරණය කරන ලද
# 15 ශ්‍රීලපාහ කොනොනි සමාජ ශාලාව



15 ශ්‍රීලපාහ නවීකරණය කරන ලද කොනොනි සමාජ ශාලාව ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්කේජේයු ජයරත්න ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ආරාධනයෙන් 22 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් කේපීඒ ජයසේකර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් 2017 නොවැම්බර් මස 07 වන දින සුභ මොහොතින් විවෘත කරන ලදී.

බළඇණි පුවත් | 16 (සෙව්) ශ්‍රීලපාහ

# 10 වන සංවත්සරය
## අභිමානයෙන් සැමරූ 16 (සෙව්) ශ්‍රීලපාහ





වර්ෂ 2007 ක් වූ දෙසැම්බර් මස 01 වන දින මේජර් බීජේ ලේකම්ගේ ආර්එස්පී ශ්‍රීලපාහගේ අණදීම යටතේ ස්ථාපනය කරණ ලද 16 වන (සෙව්) බළඇණිය 57 වන ප්‍රහාරක සේනාංකය යටතේ උතුරු මානුෂිය මෙහෙයුමට එක් වූ ප්‍රථම ස්වේච්ඡා බළඇණිය වේ. 2017.12.01 වන දින 10 වන සංවත්සරයට සමගාමීව අරිවුච්චෝලේයි ළමා නිවාසයේ ළමුන් 43 දෙනෙක් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් ලබාදුන් අතර. 2017.12.03 වන දින අණදෙන නිලධාරි මේජර් යූආර්එල් පෙරේරා ශ්‍රීලපාහ වෙත ලබාදුන් සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලිය අභිමානයෙන් පිළිගත් අතර, එතුමන් සුරතින් අඹ පැලයක් රෝපණය කරන ලදී.

එදින ඒකකයේ සියලුම ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය වන පරිදි ක්‍රීඩා තරඟාවලියක් පැවැත්වූ අතර, ක්‍රිකට් තරඟය හා කඹ ඇදීමේ තරඟය ජයග්‍රහනය කළ අණ සහ පාලන කණ්ඩායම වෙත හා අත්පන්දු තරඟාවලිය ජයග්‍රහනය කළ "බී" කණ්ඩායම වෙත ත්‍යාග සහ කුසලාන ප්‍රධානය කිරීම අණදෙන නිලධාරි විසින් සිදුකරන ලදී. ඉන් පසු 16 සුපර් හැකල් සංගීත කණ්ඩායමේ මියුරු සරින් වර්ණවත් වූ 16 (සෙව්) ශ්‍රීලපාහ 10 වන සංවත්සරය නිමාවට පත් විය.

# මැරතන් තරඟාවලියේ විශිෂ්ටයන් වූ 16 (සෙව්) ශ්‍රීලපාහ



57 වන සේනානංකය විසින් පවත්වන ලද මැරතන් තරඟාවලියේ විශිෂ්ඨ ජයග්‍රහනයක් ලබා ගැනීමට 16(සෙව්) ශ්‍රීලපාහ ඒකකයට හැකි විය. තරඟයේ ජයග්‍රාහකයින් හට පදක්කම් හා සහතික පත් ප්‍රදානය කිරීම ආරක්ෂසේනා මුලස්ථානය කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරල් ඒ කාරියකරවන ආර්එස්පි එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සුරතින් සිදුකරන ලද අතර, ජයග්‍රාහී කණ්ඩායම දිරිමත් කර මඟපෙන්වා දුන් ඒකකයේ අණදෙන නිලධාරි තුමන් හට කණ්ඩායම් ශූරතාවයට හිමි කුසලානය කිළිනොච්චි ආඥාපති තුමන් සුරතින් පිරිනමන ලදී.

# 23 සේනාංක අයත් විශේෂ ආබාධ වලින් පෙලෙන පුද්ගලයින් 100 දෙනෙකු වෙනුවෙන්

# රෝදපුටු 100 ක්



17 ශ්‍රීලපාහ අණදෙන නිලධාරී මේජර් ජේර්වල් ද සොයිසා ශ්‍රීලපාහ ගේ හා 11 ශ්‍රීලපාහට අයත් සෙ/318549 කෝප්‍රල් ප්‍රසාද් පිච්ල්පේ (සාමදාන විනිසුරු) යන කොනොනිගේ සම්බන්ධීකරණයෙන් 23 සේනාංක මුලස්ථානයේ සහ 233 බසේමු හි පූර්ණ අධීක්ෂණය යටතේ ප්‍රියාන් මැණික් අධිපති ප්‍රියංග පුෂ්ප කුමාර මැතිතුමාගේ පරිත්‍යාග යෙන් 23 සේනාංක මුලස්ථානයට අයත් විශේෂ ආබාධ වලින් පෙලෙන පුද්ගලයින් 100 දෙනෙකු වෙනුවෙන් 2017.07.17 වන දින රෝද පුටු බෙදා දෙන ලදී. සේනාංක බළ ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ට අයත් ග්‍රාමසේවා වසම්වලින් තෝරාගත් දිලිඳු පවුල්වල ඇවිදීමට හැකියාවක් නැති හා රෝද පුටුවක් ලබා ගැනීමට තරම් ආදායමක් නොමැති සිංහල, දෙමළ හා මුස්ලිම් ආබාධිත පුද්ගලයින් 100 දෙනෙකු වෙනුවෙන් රෝදපුටු බෙදාදෙන ලදී. මෙම උත්සවයේ ආරාධිත අමුත්තා ලෙස ආසේමු(නැ) ආඥාපති තුමන් පැමිණි අතර, එම අවස්ථාවට ප්‍රදේශයේ සියලුම ආගමික නායකයින් ද යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟින් රෝද පුටු පරිත්‍යාග ශීලී ප්‍රියංග පුෂ්ප කුමාර මහතා ද සහභාගී විය. ආරාධිත අමුත්තන් විසින් ආබාධිත පුද්ගලයින් හට රෝද පුටු බෙදාදෙන ලද අතර, මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා 23 සේනාංකය හා එක්ව බසේමු හා ඒකකයන්හි සහයෝගයෙන් ආබාධිත පුද්ගලයින් හට ප්‍රවාහන පහසුකම් ද උත්සවය සඳහා සහභාගීවූ ආබාධිතයින් හට විඩාව නිවාගැනීමට පැරබොලික් ආවරණයක් සකස් කරන ලදී. පැමිණ සිටි සියලුම අයවලුන් හට තේ පැන් සංග්‍රහයක් ද පිරිනැමීමෙන් අනතුරුව මෙම වැටසටහන නිමාවට පත් විය.



# 18(සෙව්) ශ්‍රීලපාහ
# බලඇණි පුහුණු පාඨමාලාව



55 වන සේනාංක බලඇණි පුහුණු පාසල වෙත්තලකර්නි හිදී 2017.08.01 වන දින බලඇණි පුහුණු පාඨමාලාව ආරම්භ කළ 18 (සෙව්) ශ්‍රීලපාහ වෙත ආරම්භක දේශණය 553 බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගෙ ්ඩියර් ඒජීපිඑන් ජයසුන්දර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් පවත්වන ලදී.

මෙම පාඨමාලාව හදාරනු ලැබූ නිලධාරී හා සෙසුනිලයින් හට සේවා ඒකක පිලිබඳ දැනුමක් ලබාදීමේ අරමුණින් ආසේමු (යා) බලප්‍රදේශයේ ස්ථාපිත 4 ශ්‍රීලංසසබ, 5 ඉසෙරෙ, 3 ශ්‍රීලංසංබ, 4 ශ්‍රීලංකාහ සහ උතුරු නාවික විධානය - කන්කසන්තුරය යන ඒකක සහ ස්ථාන නිරීක්ෂණ චාරිකාවක් සිදුකරන ලදී. එමෙන්ම දින 45 ක කාලසීමාවක් පුරා පැවති මෙම පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරී හා සෙසුනිලයින්ට අවැසි මඟපෙන්වීම සහ උපදෙස් ලබාදීම ඒකක අණදෙන නිලධාරී මේජර් එච්එම්පීසී හේරත් ශ්‍රීලපාහ විසින් සිදුකරන ලද අතර, 2017.09.25 වන දින බලඇණි පුහුණු පාඨමාලාව නිම කරන ලදී. පාඨමාලාවේ අවසන් දේශණය 55 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩිසී පිඑස්සී විසින් සිදුකිරීමෙන් පසු පාඨමාලාවේ දක්‍ෂතා දක්වන ලද සියලුම නිලයින් හට කුසලාන පිරිනැමීම සේනාංකාධිපති තුමන් විසින් සිදුකරන ලදී.





# 9 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ 19 ශ්‍රීලපාහ



19 ශ්‍රීලපාහ සිය විජයග්‍රාහී 09 වන සංවත්සරය 2017.10.23 වන දින සමරන ලදී. මෙදිනට පාබල හමුදා රෙජිමේන්තුවේ ද සංවත්සරය යෙදී තිබූ බැවින් 19 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි තුමන් එම සංවත්සරයට සහභාගී වූ අතර, ඒකකයේ සිටි අනෙකුත් සියලුම නිලයින් විසින් සංවත්සරය අභිමානවත්ව සැමරීමට කටයුතු කරන ලදී. එහිදී මෙම ඒකකය සමගින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මිය යන ලද එක් නිලධාරියෙකු හා සෙසුනිළයින් 29 දෙනා සිහිවීම පිණිස ඒකක භූමියේ පොල් පැළ රෝපණය කළ අතර, ඒකක විහාර පරිශ්‍රය තුලදී තම මව්බිම කුරිරු ත්‍රස්ථවාදීන්ගෙන් මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුමේදී අප අතරින් සමුගත් වීරෝධාර රණවිරුවන් මෙන්ම සටනේදී තුවාල ලබා ආබාධිත තත්වයට පත් රණවිරුවන්ටද ඉක්මන් සුවය හා සේවයේ යෙදී සිටින සියලුම නිලයින් ද, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හා සිවිල් සේවක මහතුන්ට ද සෙත් පතා කිලිනොච්චිය ලුම්බිණි විහාරයේ ස්වාමින් වහන්සේ නමක් වැඩම කරවා බෝධිපූජා පිංකමක් පවත්වන ලදී.

2017.11.16 වන දින අණදෙන නිලධාරි වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමූ අතර, නවතමයෙන් ඉදි කරන ලද 19 ශ්‍රීලපාහ නිලධාරි නිවස්නය අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑම්එස්ජේ තෙන්නකෝන් ආර්එස්පී ශ්‍රීලපාහ ගේ සුරතින් විවෘත විය. එදින සන්ධ්‍යාව 1 වන සිංහ රෙජිමේන්තුවට අයත් අධිරිද්ම සංගීත කණ්ඩායමේ සංගීත රාවයෙන් වර්ණවත් විය.

බළඇණි සංවත්සරයට දිනට සමගාමීව 2017.11.25 වන දින බළලත් නිලධාරි හා සැරයන් නිවස්නයේ සම්ප්‍රදායානුකූලව පවත්වාගෙන යනු ලබන තිළිණ ප්‍රදානය සඳහා විශ්‍රාමික බළලත් නිලධාරින් හා ජ්‍යේෂ්ඨ කොනොනින් ගෙන්වා තිළිණ ප්‍රදානයක් ද සිදු කරන ලදී.





# 20 ශ්‍රීලපාහ නව නිලධාරී නිවස්නය PRESTIGE



ලුතිතන් කර්නල් අයිපී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් සුභ මොහොතින් අරඹන ලද මෙම සංවර්ධන ව්‍යාපෘතිය ඒකකයට පැමිණි සිව්වන අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ඩබ්ලිව්පීඩීඑම් අමරසිංහ ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහගේ මඟපෙන්වීම මත වසර දෙක හමාරක කාලයක් තුල ඒකකයේ සියලුම නිලයින්ගේ මහත් පරිශ්‍රමයෙන් ඉදිකරන ලද මෙම නිලධාරී නිවස්නය **“PRESTIGE ”**, “ගෞරවය” ලෙසින් නම් කරන ලදී.

2017 ක් වු නොවැම්බර් මස 19 දින මෙම නිලධාරී නිවස්නය 20 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරීගේ ආරාධනයෙන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන හා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේවීඩීචී කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සුරතින් කඳවුරු පරිශ්‍රයේදී විවෘත කරන ලදී. මෙම උත්සවයට 66 සේමු සේනාංකාධිපති මේජර් ජෙනරල් ඩීසී කැප්පෙට්වලාන ආර්එස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ද, ශ්‍රී ලංකා පාබල හමුදා මධ්‍යස්ථාන සේනාවිධායක ද, ආසේමු (කිලි) බ්‍රිගේඩියර් (ප්‍රමානි) හා ඒකකයේ පෙර සිටි අණදෙන නිලධාරීන් තිදෙනාම ද සහභාගී විය.



මෙම නිලධාරී නිවස්නය ආලින්ද 06 කින් යුක්ත වන අතර, මෙම පරිශ්‍රය “අභිමානයේ පරිශ්‍රය” “Heritance corridor ” ලෙසින් සකසා ඇති අතර, එහි මධ්‍යස්ථයේ ඉහලින් වූ පාබල හමුදා ලාංඡනය ද, දෙපසින් ඉර හා හඳ ද, භූමියෙහි වළාකුළු බැම්මෙන් ආරක්ෂාවූ මුරගල් 2 කින් ද, ඉන් ඔබ්බෙහි මුරායුධ 2 ක් හා සේසත් 2 ක් ස්ථානගත කර ඇත. මෙහි ඉර හඳ ශ්‍රී ලංකා පාබල හමුදාව සදාකාලික බව ද, මුරගලෙන් ඒකක හඨපිරිස් ද, වළාකුළු බැම්මෙන් සශ්‍රීකත්වය ද, මුරායුධ මඟින් යුද්ධයේදී පෙරමුණ ගැනීම හා සේසත් මඟින් සංස්කෘතිය, සම්ප්‍රදාය හා ආගන්තුක සත්කාරයෙන් දිවිහිමියෙන් රට ජාතිය සුරකින බව විද්‍යාමාන කරයි.

විසිත්ත කාමරය “විජයග්‍රහණයේ පරිශ්‍රය” “Victory Corridor ” ලෙස නම් කර ඇති අතර ඒකක කොනොනියෙකුගේ පැන්සලින් පමණක් නර්මාණය වූ එළාර දුටුගැමුණු සිතුවම පිළිබිඹු කරනු ලබයි. මෙම සිතුවම රෙජිමේන්තු අධිපති තුමන්ගේ සුවිශේෂී ඇගයීමකට ලක් වූ අතර, සෙ/327221 කෝප්‍රල් අබේසිංහ ඒඑම්එස්එම් විසින් එය නිර්මාණය කරන ලදී.

“ විනෝදාශ්වාද පරිශ්‍රය” “Entertaining Corridor”

නිවස්නයේ මැද මිදුල “Nature corridor” “ස්වභාවයේ පරිශ්‍රය” මෙය දිවා රාත්‍රියේදී ඉරෙ-න් හා සඳෙන් ආලෝකමත් වන පරිදි මනස්කාන්ත දිය ඇල්ලක් මෙන්ම ස්වභාවික පරිසර පද්ධතියකින් ද යුක්ත වේ.

“වේදිකා හා කැටපත් පවුර පරිශ්‍රය” “Staging mirror wall corridor” සංගීත කණ්ඩායම් ස්ථානගත කිරීම හා සතුටු සාමීචියේ යෙදීම සඳහා වෙන්කර ඇත. මෙම පරිශ්‍රයේ සිදුවූ අති සුවිශේෂිතම සිදුවීම වනුයේ ප්‍රථම වතාවට එළි දැක්වූ **“20 Flash”** ඒකකයේ අධිරිද්ම කණ්ඩායමේ කළඑළිමංගල්‍යය යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන තුමාගේ ආරාධනයෙන් සිදු විය.

නිවස්න භෝජන ශාලාව “Hospitality corridor” හෙවත් “සත්කාරක පරිශ්‍රය” වේ.

# විශිෂ්ට ජයග්‍රහන රැසක් සමගින් ක්‍රීඩාවෙන් පෙරට



ඉතා සීමිත කාලයක් තුල 21(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ ක්‍රීඩා කටයුතු වල ඉහළ අගයක් පෙන්වමින් 2017 වසරේ ජයග්‍රහන රැසකට හිමිකම් කීමට මෙම ඒකකයේ ක්‍රීඩා සාමාජිකයින්ට හැකි විය. කෙළිබිමේ ජයකෙහෙළි නංවමින් මෙවර 65 සේනාංකයේ 2017 අන්තර් ඒකක බැඩ්මින්ටන් තරඟාවලියේ ශූරතාවය ලබාගැනීමෙන් ඇරඹී 21(සෙව්) ශ්‍රීලපාහ ක්‍රීඩා හරඹය, කණ්ඩායම් 18ක් සමඟ තරඟවැද දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය සෙ/ඩී101683 සාසෙ තිලකරත්න ඩබ්ජීසීඑම් යන ක්‍රීඩකයා විසින් හිමිකරගැනීමත් සමඟ තහවුරු කරගන්නට හැකි විය. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 65 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් ඩබ්ඒඑස් වීරවර්ධන ආර්ඒපී යූඑස්පී අයිපී ජ්‍යෙෂ්ඨ නිලධාරි සහභාගී විය.

ආසේමු (කිළි) 2017 අන්තර් ඒකක ක්‍රිකට් තරඟාවලියේ ශූරතාවය ද ඒකකයේ ක්‍රිකට් කණ්ඩායම විසින් හිමිකරගැනීමට සමත් වූ අතර, සමස්ථ තරඟාවලියේ හොඳම පන්දු යවන්නාට හිමි සම්මානය සෙ/21ඩී00470 ලාකෝ පතිරණ පීඑන්ඒ යන ක්‍රීඩකයා විසින් හිමි කර ගන්නා ලදී. සමස්ථ තරඟාවලියේ හොඳම පිතිකරුවාට හිමි සම්මානය සෙ/ඩී100132 සාසෙ මනෝජ් යූඑච්ඩී ක්‍රීඩකයා විසින් හිමි කර ගත් අතර, අන්තර් ඒකක එල්ලේ තරඟාවලියේ ද ජයග්‍රහනය ලබමින් සමස්ථ තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය සෙ/ඩී100132 සාසෙ මනෝජ් යූඑච්ඩී යන ක්‍රීඩකයා විසින් හිමි කර ගන්නා ලදී. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථාන කිළිනොච්චි ආඥාපති මේජර් ජෙනරල් අජිත් කාරියකරවන යූඑස්පී එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සහභාගී විය.



**බැඩ්මින්ටන් තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා සෙ/ඩී101683 සාසෙ තිලකරත්න ඩබ්ජීසීඑම්**



**ක්‍රිකට් තරඟාවලියේ හොඳම පන්දු යවන්නා සෙ/21ඩී00470 ලාකෝ පතිරණ පීඑන්ඒ**



**සමස්ථ තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා සෙ/ඩී100132 සාසෙ මනෝජ් යූඑච්ඩී**

# 68 වන යුද හමුදා දිනයට නව අරුතක් එක්කල 23 ශ්‍රීලපාහ



**2010.10.10 දිනට යෙදී තිබූ 68 වන යුද හමුදා දිනයට සමගාමීව 23 ශ්‍රීලපාහ විසින් එහි අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් ටීඑල්එම් චන්ද්‍රසේකර ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ඒකකයේ සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් වැඩ සටහන් මාලාවක් දියත් කරන ලදී.**

මුලතිව් නගර සභාව සමඟ එක්ව 2017.10.08 වන දින සුන්දර මුලතිව් මුහුදු තීරයේ එක්රැස්වී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කරමින් එහි සුන්දරත්ව රැකගැනීම සඳහා දායකත්වය ලබාදෙන ලද අතර, 2017.10.09 වන දින වඩ්ඩුවාකල් කන්නකිඅම්මාන් කෝවිල් පරිශ්‍රය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් පැවැත්වීම සහ එදින සන්ද්‍යාවේ සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් මියගිය රණවිරුවන් සිහිපත් කරමින් පිං අනුමෝදනා කර ත්‍රස්ථවාදී ප්‍රහාරයන්ගෙන් තුවාල ලැබ ප්‍රතිකාර ලබන සියළු රණවිරුවන් හට ඉක්මන් සුවය ද, සියළු ආරක්ෂක අංශ සාමාජිකයින් හට ද සෙත් පතා සිරි සමුද්‍රගිරි රජමහා විහාරස්ථානයේ බෝධිපූජා පිංකමක් පවත්වන ලදී.

සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් 2010.10.10 දින උදෑසන ඒකක අණදෙන නිලධාරි ගේ ප්‍රධානත්වයෙන් ඒකක ධජය එසවීමෙන් අනතුරුව "පරිසරය සුරකිමු" යන තේමාව යටතේ පරිසර හිතකාමී දුර්ලභ ශාක රෝපණය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. එදින දහවල් ඒකකයේ සියලුම නිලයින් සමගින් දිවා භෝජන සංග්‍රහයක් පවත්වමින් 68 වන යුද හමුදා දිනය වර්ණවත් කල 23 ශ්‍රීලපාහ බළඇණි වැඩසටහන් මාලාව නිමාවට පත්විය.



# 8 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ 24 ශ්‍රීලපාහ



නව ඒකකයක් ලෙස 2009.09.25 වන දින ස්ථාපනය කරන ලද 24 ශ්‍රීලපාහ තම 8 වන බළඇණි සංවත්සරය 2017.09.25 වන දින මහත් අභිමානයෙන් යුතුව සමරන ලදී.

බළඇණි දිනයට සමගාමීව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් බීඑච්එම්සී බෙලිගස්වත්ත ආර්එස්පී ශ්‍රීලපාහ වෙත කඳවුරු මුරයක් පිරිනැමීමෙන් පසු එළැඹි සුභ මොහොතින් ඒකක කඳවුරු භූමියයේ අඹ පැළයක් රෝපණය කරන ලදී. ඉන් ඉක්බිති සියලු නිලයින් ඇමතූ අණදෙන නිලධාරි තුමන් මනා පුහුණුව හා විනයගරුක සෙබලුන් පිරිසක් ලෙසින් සියලු දෙනා ඇප කැපවී තම රාජකාරිය නොපිරිහෙලා ඉටුකරමින් කටයුතු කිරීමෙන් 24 ශ්‍රීලපාහ අනෙකුත් බළඇණි අතුරින් හොඳම බළඇණිය බවට පත්කරගැනීමට හැකියාව ලැබෙන බව පැවසී ය.

2017.09.27 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අබියස ඒකකයට හා එහි සියලුම සාමාජිකයින් හට සෙත්පතා බෝධිපූජා පිංකමක් සිදුකරන ලද අතර, 2017.10.27 වන දින සිට 2017.12.20 වන දින දක්වා බළඇණි පුහුණුවීම් සඳහා නිලධාරීන් 12 දෙනෙකු සහ සෙසුනිලයින් 308 සහභාගී විය.



## විරු සුමිතුරු නිවසේ වැඩ 60% ක් නිමයි.

24 ශ්‍රීලපාහ භට පිරිස්හි ශ්‍රම දායකත්වයෙන් ආරක්ෂක අමාත්‍යංශ "විරු සුමිතුරු" නිවාස ව්‍යාපෘතිය යටතේ 6 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/309791 සැරයන් දයාවංශ ජේඑම්එන් ජ්‍යෙකොනොනි වෙනුවෙන් ඉදිවන නිවසෙහි ඉදිකිරීම් කටයුතු 60%ක පමණ ප්‍රමාණයක් මේ වන විට නිමකර ඇත. මෙම නිවසේ ඉදිකිරීම් කඩිනමින් නිම කිරීමට අණදෙන නිලධාරි තුමන්ගේ අධීක්ෂණයෙන් උපදෙස් ලබාදී ඇති අතර, තව නොබෝ දිනකින් එම නිවස විවෘත කර එම ජ්‍යෙකොනොනි වෙත ලබාදීමට කටයුතු යොදා ඇත.

# 7 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ 25 ශ්‍රීලපාහ



25 ශ්‍රීලපාහ නිත්‍ය බළඇණියක් ලෙස 2010 සැප්තැම්බර් මස 20 වන දින පිහිටුවනු ලැබීමෙන් පසුව අණදෙන නිලධාරීන් 6 දෙනෙකුගේ මඟ පෙන්වීම යටතේ පාබල හමුදා ඒකක අතර කැපී පෙනෙන ස්ථානයකට අද වනවිට පත්ව ඇත. එලෙස ආ ගමන් මගෙහි 7 වන වසර මෙවර ඉතා විශිෂ්ට අන්දමින් සංවිධානය කර තිබූ අතර, ඒ සඳහා වැඩසටහන් කිහිපයක් පෙලගස්වා තිබුණි. 2017.09.20 වන දින උදෑසන ආගමික වතාවත් වලට මුල් තැන දෙමින් ධර්ම දේශනාවක් සිදු කර ඒකකයේ රාජකාරියෙහි නියුතු සියලුම නිලයන් හට සෙත් පතමින් දානමය පිංකමක් සිදු කරන ලදී. පසුව අණදෙන නිලධාරි තුමා හට සම්මාන මුරයක්ද, රුක්රෝපණ වැඩසටහනක් ද සියලුම නිලයින් වෙනුවෙන් භෝජන සංග්‍රහයක්ද පවත්වන ලදී.

## නවීකරණය කර නව මුහුණුවරකින් විවෘත කරන ලද 25 ශ්‍රීලපාහ කොනොනි සමාජ ශාලාව

ඒකකයට මහත් අඩුපාඩුවක්ව පැවති කොනොනි සමාජ ශාලාව ඉදි කිරීම 2014 වසරේදී එවකට අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් යටතේ සිදු කරන ලදී. එලෙස විවෘත කරන ලද කොනොනි සමාජ ශාලාව නවීකරණය කරමින් වත්මන් අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒබී දොඩම්වල පීඑස්සී ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ මඟපෙන්වීම යටතේ සියලුම නිලයින්ගේ දායකත්වයෙන් සියලු පහසුකම් සපිරිව 2017 සැප්තැම්බර් මස 07 වන දින සුභ මොහොතින් විවෘත කරණු ලැබීය.



# 7 වන සංවත්සරය අභිමානයෙන් සැමරූ 26 ශ්‍රීලපාහ



පුරා වසර 7 ක් වැනි කෙටි කාලයක් තුලදී ඒකකය ගොඩනැගීම උදෙසා කැපවීමෙන් යුතුව තම බුද්ධිය හා දායකත්වය ලබාදෙමින් රාජකාරි ඉටුකරනු ලබන සාමාජිකයින්ගෙන් සමන්විත මෙම ඒකකය 2017.09.20 වන දිනට යෙදුණු තම 7 වන ජන්ම දිනය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ක්‍රීඩා ඉසව් හා වෙනත් විශේෂාංග රැසකින් සමන්විතව ඉතා උසස් අන්දමින් සමරන ලදී.

මෙදින කණ්ඩායම් අතර පැවැත්වූ ක්‍රිකට් තරඟාවලිය හා අත්පන්දු තරඟාවලියෙන් ජයග්‍රාහී කණ්ඩායම් වලට හා ක්‍රීඩකයින්ට මෙන්ම, පසුගිය දිනවලදී 61 වන සේනාංකය වෙතින් සංවිධානය කළ ක්‍රිකට් තරගාවලිය හා පාපන්දු තරඟාවලිය ජයග්‍රහනය කල මෙම ඒකක ක්‍රීඩා කණ්ඩායම් වෙත ද ත්‍යාග හා සහතික පත් ලබාදීමේ ඉතා උත්කර්ෂවත් සම්මාන රාත්‍රියක් අණදෙන නිලධාරි තුමාගේ ප්‍රධානත්වයෙන් 2017.09.18 වන දින ඒකකයේ "සව්බළ සිනමා" හල තුලදී සිදුකරන ලදී. සංවත්සරයට සමගාමීව අණදෙන නිලධාරි තුමන් වෙත කඳවුරු සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමෙන් පසු ඒකකය තුල රාජකාරි නිරතව සිටින සියලුම නිලයින්ට හා සිවිල් සේවක මහතුන්ට සෙත් පතා ගිහි පිංවතුන් 08 දෙනෙකු සහභාගී කරවමින් සර්වරාත්‍රික පිරිත් දේශනයක් පවත්වා හීල්දානය පිරිනැමීමෙන් පසු සංවත්සරය සමාප්ත කරන ලදී.



**නිවැරදි විසඳුම් පත් 2018 මාර්තු මස 31 වන දිනට පෙර එවිය යුතුය.**
**තරඟ කූපනය සහ කොන්දේසි පහත සඳහන් කර ඇත.**

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කල යුතුයි.

2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.

3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් හට පිළිවෙළින් රු.1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.

4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.

5. නිවැරදි පිළිතුරු පත් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි ලබා දීම සිදු කෙරේ.

6. පිළිතුරු පත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ ''වයිට් හැකල් ප්‍රහේලිකා අංක ,71'' යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය :
වයිට් හැකල් කර්තෘ,
වයිට් හැකල් ප්‍රකාශන අංශය,
රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ
යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම.

## වයිට් හැකල් ප්‍රහේලිකා අංක 71

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 7 | | 6 | 5 | | | 4 | 8 |
| 3 | 4 | | 2 | | 9 | | 1 | 6 |
| | | | | 1 | 4 | | | |
| 8 | 5 | | 9 | 7 | | | 2 | 3 |
| 7 | | 4 | | 2 | | 8 | | 9 |
| | 2 | 9 | | | | 1 | 7 | |
| | | | 4 | 9 | | | 8 | |
| 2 | 9 | | 1 | | 7 | 6 | 5 | |
| 4 | 1 | | | 6 | 5 | | | |

## ප්‍රහේලිකාව ගැන...

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.

3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුළ හා සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

## වාසනාවන්ත
## සුබ මංගලම්



2017.09.13 වන දින යුග දිවියට පා තැබූ 24 ශ්‍රීලපාහ ඒකකයේ නි/68589 කපිතාන් ඩීඑම්ඩීසී දිසානායක ශ්‍රීලපාහ හා ශෙහානි ගාල්ලගේ මෙනවිය.

# ප්‍රහේලිකාව - 71

අංකය: ..............................

නිලය: ..............................

නම: ..............................

..............................

රාජකාරි ලිපිනය : ..............................

..............................

..............................

ඒකකය : ..............................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

යුහ හැඳුනුම්පත් අංකය : ..............................

## නිවැරදි විසඳුම්පත් මෙම කූපනය සමඟ අප වෙත එවන්න

# මංගල සීනු



2017 සැප්තැම්බර් 13 වන දින යුග දිවියට පාතැබූ 23 ශ්‍රීලපාභ ඒකකයට අයත් නි/69132 කපිතන් වයිඒකේපි මදුශංක ශ්‍රීලපාභ හා තෙපුලි සුභාෂිණී මෙනවිය.

# වාසනාවන් සුබ මංගලම්



2017 ඔක්තෝබර් මස 27 වන දින යුග දිවියට පා තැබූ 10 ශ්‍රීලපාභ ඒකකයට අයත් සෙ/327690 ලාකෝ හදුන්ගේ එච්ඩීඑස්කේ හා බුද්ධිකා මනෝරි මෙනවිය.



2017 ජුනි මස 14 වන දින යුග දිවියට පා තැබූ 23 ශ්‍රීලපාභ ඒකකයට අයත් සෙ/330861 ලාකෝ ලියනගේ එස්කේ හා දර්ශණී ලක්මාලී මෙනවිය.



2017 මැයි මස 08 වන දින යුග දිවියට පා තැබූ 23 ශ්‍රීලපාභ ඒකකයට අයත් සෙ/328250 ලාකෝ ලීලාරත්න කේකේටීඑන් හා අරුණි චන්ද්‍රිකා මෙනවිය.

# සුභ උපන් දිනයක් වේවා



2017.10.01 වන දින 5 වන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සැරයන් නලින් කුමාර P ගේ ආදරණීය පුතු
**චමුදිත බුද්ධි කුමාර**



2017.10.16 වන දින 3 වන උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ කෝප්‍රල් ජයවර්ධනJMPLගේ ආදරණීය දියණිය
**මෙත්මි පහනයා**



2017.09.04 වන දින 2 වන උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ කෝප්‍රල් ලක්මාල් AABM ගේ ආදරණීය දියණිය
**වෙනුමි එලානා**



2017.10.20 වන දින 1 වන උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ ලාකෝ ගුණරත්න WDNK ගේ ආදරණීය දියණිය
**දැහැමි නිහිංසා**



2017.10.20 වන දින 6 වන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සැරයන් සුමනකුමාර KHM ගේ ආදරණීය දියණිය
**දිනිති නිම්සරා**



2018.10.29 වන දින 2 වන උපන් දිනය සැමරූ 23 ශ්‍රීලපාහ ලාකෝ සම්පත් MAP ගේ ආදරණීය දියණිය
**හංසනී උදයාංගනි**



2017.12.05 වන දින 1 වන උපන් දිනය සැමරූ 1 ශ්‍රීලපාහ ලාකෝ රත්නකුමාර DKNN ගේ ආදරණීය පුතු
**මහෙන්ස සස්මිත**



2017.06.20 වන දින 1 වන උපන් දිනය සැමරූ 17 ශ්‍රීලපාහ සාසෙ ද සිල්වා GSS ගේ ආදරණීය පුතු
**මෙතිර විදුනිම**



2017.05.07 වන දින 6 වන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ කෝප්‍රල් චන්ද්‍රසේකරNMJP ගේ ආදරණීය දියණිය
**සෙතුමියා තිත්‍රාකි**



2017.06.03 වන දින 4 වන උපන් දිනය සැමරූ 7 ශ්‍රීලපාහ කෝප්‍රල් චන්ද්‍රසේකරNMJP ගේ ආදරණීය දියණිය
**ලිතුලි සෙහන්සා**



2017.04.19 වන දින 2 වන උපන් දිනය සැමරූ 12 ශ්‍රීලපාහ කෝප්‍රල් අජිත් කුමාර RM ගේ ආදරණීය දියණිය
**සඳමි ලිහන්සා**



2017.10.29 වන දින 6 වන උපන් දිනය සැමරූ 16 ශ්‍රීලපාහ සාසෙ ප්‍රේමරත්න GGPS ගේ ආදරණීය දියණිය
**චතුමි කෞෂල්‍යා**



2017.10.10 වන දින 2 වන උපන් දිනය සැමරූ 15 ශ්‍රීලපාහ සාසෙ විජේරත්න IGJN ගේ ආදරණීය දියණිය
**මහීෂි සෙහන්සා**



2017.11.6 වන දින 8 වන උපන් දිනය සැමරූ 8 ශ්‍රීලපාහ බනි 11 සෙනෙවිරත්න MM ගේ ආදරණීය පුතු
**විබෝධ යෙහෙන්**



2018.01.21 වන දින 7 වන උපන් දිනය සැමරූ 20 ශ්‍රීලපාහ සාසෙ දර්ශික KGT ගේ ආදරණීය පුතු
**එරංග ප්‍රමෝද් රශ්මිණ**



2017.12.22 වන දින 2 වන උපන් දිනය සැමරූ 10 ශ්‍රීලපාහ බනි II රුවන් කුමාර SA (RSP) ගේ ආදරණීය පුතු
**ලෙෂාන් ලක්නද**

## වාසනාවන් සුබ මංගලම්



2017 මැයි මස 23 වන දින
යුග දිවියට පා තැබූ 25 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/325886
ලාකෝ සමන්ත කේකේවී හා
සමන්ති ලක්මාලි මෙනවිය.


ARMY PARA
CHAMPIONS
2017
RHQ BATALION
OF SRI LANKA
LIGHT INFANTRY
ARMY PARA GAM